# රණවිරුවා

2024 ජූනි • 267 කලාපය





නිදහස සෙවණ රැකවරණය මිස රටට
අදහස නොමැත අන් කිසිවක් විරුවකුට
මදහස නගන දියණිය හුරතල් කමට
සෙනෙහස දැනී සැනසුම ගෙන දෙයි හිතට

ලුතිනන් කර්නල් සුජිත් චමින්ද

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.





# "ගුරුදෙව් සුව අරණ" විවෘත කෙරේ

අපවත් වී වදාල අතිපූජ්‍ය මාපලගම සිරි සෝමිස්සර නාහිමිපාණන්ගේ සංකල්පයක් මත කොහුවල ශ්‍රී ධාතුමළු විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය පිටිගල සෝනුත්තර නායක හිමිපාණන්ගේ අනුශාසනාවකට අනුව හෝමාගම, කිරිවත්තුඩුව ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ "ගුරුදෙව් සුව අරණ" භික්ෂු රෝහල විවෘත කිරීමේ උත්සවය පසුගිය ජූනි මස 01 වන දින පැවති අතර, එම අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද සහභාගී විය.



භික්ෂූන් වහන්සේලා 50 නමකට ප්‍රතිකාර කළහැකි පස්මහල් හා තෙමහල් ගොඩනැගිලි සංකීර්ණයක් සහ භික්ෂූන් වහන්සේ 500 නමකට භාවනායෝගීව වැඩවාසය කළහැකි එම පරිශ්‍රය විවෘත කෙරුණේ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ සුරතිනි. 6 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හටපිරිස්හි ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික දැනුම භාවිතා කරමින් මෙම රෝහලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකරගැනීමට හැකියාව ලැබිණි.





# "යුද හමුදාධිපති ජාතියට දුන් පොරොන්දුව" ග්‍රන්ථය එළිදැක්වේ

ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා විසින් රචනා කරන ලද "යුද හමුදාපති ජාතියට දුන් පොරොන්දුව" ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවය 2024 ජුනි මස 28 වන දින සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙම උත්සව අවස්ථාවට ගරු කථානායක, කැබිනට් අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු, තානාපතිවරු, මහ කොමසාරිස්වරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වූහ.

එහිදී, ආචාර්ය රිචඩ් ද සොයිසා විසින් ග්‍රන්ථය පිළිබඳව විචාරයක් සිදු කරන ලද අතර, කතුවරයාගේ හමුදා ජීවිතය සම්බන්ධ කැපවීම පිළිබඳව පැමිණ සිටි පිරිසගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා කෙටි වීඩියෝවක් ද ප්‍රදර්ශනය කෙරිණි. ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා එහිදී සභාව අමතමින් සිය ග්‍රන්ථයේ පළමු පිටපත ප්‍රධාන ආරාධිත අමුත්තා වෙත උත්සවාකාරයෙන් පිළිගන්වා විශේෂ සමරු තිළිණයක් ද ප්‍රදානය කළේය.









# විශ්‍රාමික රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ පරිපාලන කටයුතු පිළිබඳ සොයාබැලේ









බදුල්ල සහ මොණරාගල ප්‍රදේශයන්හි විශ්‍රාමික රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ සහභාගීත්වයෙන් පසුගිය ජූනි මස 01 වන දින උත්සවයක් පැවැත්විණි. ඔවුන්ගේ සුවදුක් විමසීම සහ පරිපාලන කටයුතු පිළිබඳව සොයාබැලීමේ අරමුණින් සංවිධානය කෙරුණු මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා සහභාගී විය.



යුද්ධ හමුදා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය, පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, නීති සේවා මානව හිමිකම් සහ මානුෂීය නීති අධ්‍යක්ෂ මණ්ඩලය, සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය, රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මෙහිදී උපකාරක මධ්‍යස්ථාන හතක් ස්ථාපිත කර තිබූ අතර, ඒව එම රණවිරුවන්ගේ ගැටලු ඉදිරිපත් කිරීමටත් ඔවුනට එම විෂයන්ට අදාළ කරුණු පිළිබඳව දැනුවත්භාවයක් ලබාගැනීමටත් අවස්ථාව හිමිවිය.





# ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියසදී පට්ඨාන ධර්ම දේශනාවක්



ඉකුත් ජූනි මස 17 වන දින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස පැවති පට්ඨාන ධර්ම දේශනාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ. පට්ඨාන ධර්ම සභා සාමාජිකයින් විසින් සංවිධානය කරනු ලැබූ මෙම උත්සවයේ ආරාධිත දේශනය පූජ්‍ය පල්ලේගම හේමරතන නායක හිමිපාණන් විසින් පැවැත්වූ අතර මල්වතු මහා විහාර පාර්ශවයේ අනුනායක දිඹුල්කුඹුරේ විමලධර්ම හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් චාරිත්‍රානුකූල පූජාවක්ද පැවැත්විණි. මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ යුද්ධ හමුදාධිපතිගේ සුරතින් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස ශ්‍රී සර්වඥ ධාතු කරඬුව තැන්පත් කරනු ලැබූ අතර, අනතුරුව මහා සංඝරත්නය විෂයෙහිලා පට්ඨාන ධර්ම දේශනාව පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ඇතුළු නිලධාරීන්, සෙසු නිලයන් සහ බැතිමත්හු විශාල පිරිසක් සහභාගී වූහ.













# මහාමායාපුර ප්‍රදේශයේ පවුලකට නව නිවසක්





ත්‍රිකුණාමලය, මහාමායාපුර ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් 2 (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුව විසින් ඉදිකළ නව නිවසක් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් පසුගිය ජුනි මස 07 වන දින විවෘත කෙරිණ.

2 (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්ජීකේඑස් ධර්මදාස ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ එම රෙජිමේන්තුවේ භටපිරිස් විසින් එහි ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූ අතර, ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචි රොහාන් ගුණසේකර මහතා මෙම ව්‍යාපෘතිය සඳහා සිය මූල්‍ය දායකත්වය ලබාදෙනු ලැබීය.

මෙම අවස්ථාවට නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ඒ කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී පීඑස්සී, 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී, එම සේනාංකය යටතේ ස්ථාපිත බලසේනාවන්හි බලසේනාධිපතිවරු, පොලිස් නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රදේශයේ සිවිල් වැසියෝ රැසක්ද සහභාගී වූහ.





# යුද්ධ හමුදාධිපති, ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) සංචාරයක




යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පසුගිය ජූනි මස 06 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) සංචාරයක නිරත වූයේය. එහිදී, නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ව් කුලතුංග ආර්ඩබ්ලිව්පි ආර්එස්පි විඑස්වි යුඑස්පි පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත එහි හටපිරිස් වෙතින් හිමිවූයේ ගෞරවණීය පිළිගැනුමකි.



එහිදී, මාතෘභූමිය මෙහෙයුමේදී දිවිපිදූ එම ආරක්ෂක සේනාවේ වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කළ යුද්ධ හමුදාධිපති සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයන්ගේ කැපවීමද ඇගයීමට ලක්කළේය. එමෙන්ම, රාජකාරී අතරතුර හටපිරිස් සමගින් සුහදතාවය පවත්වාගැනීමේ වැදගත්කම පිළිබඳව ද එතුමන් පෙන්වා දුන්නේය. අනතුරුව සියලු නිල තේ පැන් සංග්‍රහයකට ද සහභාගී වූ හෙතෙම නිලධාරීන් සහ සෙසුනිලයන් සමග සුහද පිළිසඳරක නිරත වන්නට ද අමතක නොකළේය. මෙම අවස්ථාව සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික, 22, 23 සහ 24 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හටකාර්ය සම්පාදන ආඥාපති, එම සේනාංකය යටතේ ස්ථාපිත බලසේනාවන්හි බලසේනාධිපතිවරු, අණදෙන නිලධාරීන් ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් ද එක්වූහ.





# මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ

# Captivate

## ශ්‍රවණාගාරය විවෘත කෙරේ






මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ 'Captivate' ශ්‍රවණාගාරය පසුගිය ජූනි මස 06 වන දින විවෘත කෙරිණ. එම අවස්ථාවට යුද්ධ හමුදා පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් කේටීපී සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ඇරයුමෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධාන අමුත්තා ලෙස එක්විය.

එහිදී, 400 දෙනකුට අසුන්ගැනීමේ හැකියාව සහිත මෙම ශ්‍රවණාගාරය නිරීක්ෂණය කිරීමට ද යුද්ධ හමුදාධිපති එක්විය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සාර්ථකව සිදුකරගැනීම වෙනුවෙන් 3 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හැපිරිස්ති තාක්ෂණික දැනුම සහ ශ්‍රම දායකත්වය හිමිවූහ.



අනතුරුව, යුද්ධ හමුදාධිපති ප්‍රතිත්‍රස්ත යුද උපක්‍රම හා කැලෑබද සටන් පුහුණු පාඨමාලාව හදාරනු ලබන විදේශ නිලධාරීන් සමඟ සුහද අදහස් හුවමාරුවක ද නිරතවූහ. මෙම අවස්ථාව සඳහා නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති, අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික, පුහුණු අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද සහභාගී වූහ.






# ලෝක පියවරුන්ගේ දිනය සමරා

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් මත අංක 55, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල ලිපිනයේ පිහිටා ඇති "Home for the Aged" වැඩිහිටි නිවාසයේ නේවාසිකව සිටින පියවරුන් සඳහා දහවල් ආහාරය ලබාදීමේ දානමය පිංකමක් සහ ලෝක පියවරුන්ගේ දිනය සැමරීමේ වැඩසටහනක් පසුගිය ජුනි මස 16 වන දින එම වැඩිහිටි නිවාසයේදී පැවැත්විණ. එම අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ. දානමය පිංකම අවසානයේ එම නිවාසයේ නේවාසික පහසුකම් ලබන පියවරුන්ගේ මානසික සුවතාවය උදෙසා කැලිප්සෝ කණ්ඩායමක් විසින් සංගීත රසාස්වාදය ලබාදීමටද කටයුතු සිදුකරන ලදී. අනතුරුව, නේවාසිකව සිටින පියවරුන් සඳහා ත්‍යාග පාර්සල් ද පිරිනැමිණ.







# 4 ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ සංචාරයක



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පසුගිය ජුනි මස 07 වන දින 4 ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා මූලස්ථානයේ සංචාරයක නිරත වූයේය. එහිදී, එම ඒකකයේ හටපිරිස් විසින් පිරිනැමූ සම්ප්‍රදායානුකූල හමුදා ගෞරවාචාර මධ්‍යයේ සපැමිණි යුද්ධ හමුදාධිපති, බටහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ 4 ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ අණදෙන නිලධාරී විසින් ඉතාමත් උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ.

මෙම සංචාරයේදී, යුද්ධ හමුදාධිපති එම ඒකකය යටතේ සේවයේ නියුතු නිලධාරීන් සහ සෙසුනිලයන් සමග සුහද අදහස් හුවමාරුවක නිරත වෙමින් ඔවුනගේ පරිපාලන හා සුබ සාධන අවශ්‍යතා පිළිබඳවද සොයා බැලීය.







# නව විහාර මන්දිරයක් විවෘත කෙරේ

මාතලේ, කොටුවේගෙදර සුධර්මෝදය විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ විහාර මන්දිරය පසුගිය ජූනි මස 19 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ "අනුරුද්ධ අරණ" විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය මුඟුණුවෙල අනුරුද්ධ හිමිපාණන් විසින් විවෘත කරනු ලැබූහ.




එහි ඉදිකිරීමට යෝජිත නව "බෝධි ප්‍රාකාරය" සඳහා මුල්ගල තැබීමද මෙම උත්සවයට සමගාමීව එහි සපැමිණි සම්භාවනීය අමුත්තන්ගේ අතින් සිදුවූහ.

එහිදී, යුද්ධ හමුදාධිපති ගේ සුරතින් නව විහාර මන්දිරයේ ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන් අයවළුන් වෙත විශේෂ සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකෙරිණ. මෙම පුණ්‍ය උත්සවය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් එස්.ඩී. දිසානායක මහත්මිය, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඇතුළු නිලධාරීන් සහ බැතිමතුන් රැසක් සහභාගී වූහ.









# දීපදුත්තමාරාම විහාරස්ථානයේ චෛත්‍යය නිරාවරණය කෙරේ

තිරප්පනේ, දීපදුත්තමාරාම කට්ටමුරිච්චාන විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකරන ලද චෛත්‍යය ඉකුත් ජූනි මස 22 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් නිරාවරණය කෙරිණ.

සම්ප්‍රදායික නැළුම් අංග මධ්‍යයේ විහාරස්ථානයට පැමිණි යුද්ධ හමුදාධිපති, ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩ්ඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ, 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී සහ දායක සභාවේ සාමාජිකයකු වන නලින්ද හේරත් මහතා විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය.

විහාරාධිපති පූජ්‍ය තලවේ ජිනරතන හිමියන් ඇතුළු මහා සංඝරත්නයේ සෙත්පිරිත් සජ්ඣායනා මධ්‍යයේ යුද්ධ හමුදාධිපති විසින් චෛත්‍යයේ කොත සහ විශේෂ සමරු ඵලකය නිරාවරණය කරණ ලදී. චෛත්‍යය ඉදිකිරීම සඳහා මූල්‍ය පරිත්‍යාග කරන ලද නලින්ද හේරත් මහතා ඇතුළු පුද්ගලයන් ඇගයීමට ලක්කරමින් යුද්ධ හමුදාධිපති විසින් එහිදී සංකේත ප්‍රදානයක් ද සිදුකළේය. එසේම, ව්‍යාපෘතිය සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන් යුද්ධ හමුදා හටපිරිස් වෙත ද විශේෂ තිළිණ ප්‍රදාන සිදුකළ අතර අනතුරුව, කට්ටමුරිච්චාන පාසල් සිසුසිසුවියන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් රු. 250,000.00 මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකරන ලදී. මෙම අවස්ථාවට යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, දිසාපතිවරු සහ බැතිමත්හු විශාල පිරිසක් සහභාගී වූහ.







# සඳ හිරු සෑය පොසොන් කලාපය 2024



ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව සමගින් එක්ව අනුරාධපුර සඳ හිරු සෑ පරිශ්‍රයේදී සංවිධානය කරන ලද "සඳ හිරු සෑය පොසොන් කලාපය" ඉකුත් ජූනි මස 21 වන දින උදෑසන විවෘත කෙරිණ.

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ද සහභාගී වූහ. එහිදී, ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් තඹුත්තේගම මූලික රෝහල වෙත රුධිර කාන්දු පෙරණ යන්ත්‍රයක් ද පරිත්‍යාග කරන ලදී.





තවද, සඳ හිරු සෑය පොසොන් කලාපයට පැමිණි බැතිමතුන් වෙනුවෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) විසින් සංවිධානය කරන ලද බත් දන්සැල විවෘත කිරීම ද එහිදී ආරාධිතයින්ගේ සුරතින් සිදුකෙරිණ.



මෙම අවස්ථාවට පූජ්‍ය පක්ෂය, නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී, ගුවන් හමුදාධිපති එයාර් මාර්ෂල් උදේනි රාජපක්ෂ ආර්එස්පී වීඑස්වී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී, ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඑච්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ, දිසාපතිවරු සහ ප්‍රදේශයේ බැතිමතුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.







# විජය පොසොන් ගී සරණිය 2024





"විජය පොසොන් ගී සරණිය 2024" මාතලේ විජය විද්‍යාලයේ දී ඉකුත් ජූනි මස 22 වන දින පැවැත්විණ. පාසලේ විදුහල්පති රාජිත තීක්ෂණ මහතා සහ ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් නිශාන්ත ඩයස් මහතාගේ ඇරයුමෙන් එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස විජය විද්‍යාලයේ ගෞරවනීය ආදි ශිෂ්‍යයෙක් වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. මාතලේ දිස්ත්‍රික්කයේ පාසල් 28 ක සිසු සිසුවියන් එහිදී පොසොන් භක්ති ගීත ගායනා කිරීමට සහභාගි වූ අතර, "විජය පොසොන් ගී සරණිය 2024" වර්ණවත් කරමින් ජනප්‍රිය ගායක ගායිකාවන් රැසක්ද භක්ති ගීත ගායනය සඳහා එක්වූහ.

# පොසොන් පොහොය දිනයට දන්සැලක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් හා අධීක්ෂණයෙන් එම ඒකක පූර්ණ දායකත්වය මත පොසොන් පුන් පොහොය දිනයට සමගාමීව පාන් සමග සීනි සම්බල් දන්සැලක් ඉකුත් ජූනි මස 23 වන දින සවස යුද්ධ හමුදාධිපති නිල නිවස ආසන්නයේදී පැවැත්විණ.

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද සහභාගිත්වයෙන් පැවති මෙම දන්සැල සඳහා අතිවිශාල ජනතාවක් සහභාගී වූහ.





# අකුරු කරනට දිරිය දුන් දිනක්





ක්‍රියාන්විත හා ක්‍රියාන්විත නොවන හේතුන් මත මියගිය හා ආබාධිත තත්ත්වයට පත්වූ එමෙන්ම සේවයේ නියුතු විශ්‍රාමික රණවිරුවන්ගේ දූවා දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහනක් පසුගිය ජූනි මස 27 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ උපදෙස් හා මගපෙන්වීම මත සිදුකළ මෙම සත්කාරය තුළින් යුද්ධ හමුදාවේ රාජකාරීන්හි නියුතු සිවිල් සේවකයින්ගේ දරුවන්ටද ප්‍රතිලාභ හිමිවිය.

එම අවස්ථාව සඳහා ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. මෙම ප්‍රදානෝත්සවය සඳහා 2023 වර්ෂයේ පවත්වන ලද 5 වසර ශිෂ්‍යත්ව විභාගය හා 2022 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස (සා/පෙළ) මෙන්ම අ.පො.ස (උ/පෙළ) විශිෂ්ට ලෙස සමත් පාසල් දූවා දරුවන් 143 දෙනෙක් සියලු රෙජිමේන්තු ආවරණය වන පරිදි සහභාගී වූහ.

මෙහිදී, යුද්ධ හමුදා සුභසාධක අරමුදල වෙතින් රුපියල් මිලියන 3.5 ක මුදලක් වැයදරා ශිෂ්‍යත්වලාභීන් වෙත ලබාදුන් අතර, ලංකා බැංකුව - ලේක්හවුස් ශාඛාවෙහි නව ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කර 5 වසර ශිෂ්‍යත්ව විභාගය විශිෂ්ට ලෙස සමත් (කඩඉම් ලකුණු 180 ට වැඩි) දරු දැරියන් 28 දෙනකු සඳහා රු.15,000.00 ක් බැගින්ද, 2022 වර්ෂයේ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සියලු විෂයන් සඳහා ඒ සාමාර්ථ 9 ක් ලබාගෙන විශිෂ්ට ලෙස සමත් දරු දැරියන් 74 දෙනකු සඳහා රු.20,000.00 ක් බැගින්ද, 2022 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඒ සාමාර්ථ 3 ක් ලබාගෙන විශිෂ්ට ලෙස සමත් දරු දැරියන් 41 දෙනකු සඳහා රු. 25,000.00 බැගින් ද ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

තවද, ලංකා බැංකුව වෙතින් ශිෂ්‍යත්වලාභී දූවා දරුවන් සඳහා කෑටයක්, අභ්‍යාස පොත් කට්ටලයක්, හිස් වැසුමක්, පාසල් බෑගයක් ඇතුළත් පාසල් උපකරණ කට්ටලය බැගින් ද ප්‍රදානය කරන ලදී.



# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, සිය ධූරයේ රාජකාරී අරඹයි




ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නව මාණ්ඩලික ප්‍රධානී ලෙස විජයබාහු පාබල රෙජිමේන්තුවේ මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි සිය කාර්යාලයේදී පසුගිය ජූනි මස 24 වන දින රාජකාරී භාර ගත්තේය.

වර්ෂ 1969 සැප්තැම්බර් මස 16 දින උපත ලැබූ මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී කුරුණෑගල මලියදේව විද්‍යාලයෙන් සිප්සතර හැදෑරීය. වර්ෂ 1988 ජූලි මස 26 දින යුද්ධ හමුදා නිත්‍ය බලකාය වෙත බැඳුණු එතුමන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක-31 යටතේ ඉන්දීය යුද්ධ හමුදා විද්‍යාපීඨය තුළින් මූලික හමුදා පුහුණුව ලබා තිබේ. වර්ෂ 1990 ඔක්තෝබර් මස 05 දින දෙවන ලුතිනන් වරයෙකු ලෙස අධිකාරියට පත්ව විජයබාහු පාබල රෙජිමේන්තුවට අනුයුක්ත වූ එතුමන් වසර 35 කට අධික සිය වෘත්තීය දිවිය පුරාවට අණ, මාණ්ඩලික හා උපදේශන ධූර රැසක් හොබවා විශේෂයෙන්ම ක්‍රියාන්විතයේදී සුවිශේෂී දක්කම් දැක්වූ අත්දැකීම් සහ නිපුණතාවයන්ගෙන් පරිපූර්ණ දක්ෂ නිලධාරියෙකි.

# යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක රාජකාරී අරඹයි




ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නව සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ඉකුත් ජූලි මස 26 වන දින එම මූලස්ථාන පරිශ්‍රයේදී රාජකාරී ආරම්භ කරනු ලැබීය.

මූලස්ථාන පරිශ්‍රය වෙත සපැමිණි සේනාවිධායක යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීමෙන් පසුව හටපිරිස් එතුමන් වෙත හමුදා කඳවුරු මුරයේ ගෞරවාචාරය පුදකරනු ලැබූහ. අභාවප්‍රාප්ත කපිතාන් සාලිය අලදෙණිය පීඩබ්ලිව්වී ගේ ස්මාරකය අභියසදී රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ට ගෞරවාචාර දක්වනු ලැබීමෙන් අනතුරුව ආගමික ආශිර්වාද මධ්‍යයේ නව සේනාවිධායක සංකේතාත්මකව නිල ලේඛනයකට අත්සන් තබමින් නව ධූරයේ රාජකාරී භාරගත්තේය. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ධූරයද හොබවන එතුමන් යුද බිමේද බොහෝ අත්දැකීම් සපිරි දක්ෂ නිලධාරියෙකි.



# 1 බලකායේ වෙසක් අසිරියේ
# මතක සටහන්

වෙසක් උත්සවයට සමගාමීව වෙසක් කලාපයක් සහ බත් දන්සැලක් ඉකුත් මැයි මස 23 වන සිට 25 වන දින දක්වා 1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා සම්භාවනීය අමුත්තන් සමග ඉරණමඩු සහ කිලිනොච්චි ප්‍රදේශවාසී සිවිල් වැසියන් 600 කට අධික පිරිසක් සහභාගී වූහ.









# පලාලි CIMIC උද්‍යානය සිවිල් ප්‍රජාවට තිළිණ කෙරේ

51 වන පාබල සේනාංක විසින් ඉදිකළ "CIMIC උද්‍යානය" ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින් ඉකුත් ජූනි මස 07 වන දින සුබ මොහොතින් විවෘත කරන ලදී. ප්‍රදේශයේ සිවිල් වැසියන්ගේ ඉල්ලීමකට අනුව මෙම ව්‍යාපෘතිය යුද්ධ හමුදා භටපිරිස් විසින් මසක් ඇතුළත ඉදිකර අවසන් කරන ලද අතර, යාපනයේ වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතාගේ දියණිය වන ස්විට්සර්ලන්තයේ පදිංචි වෛද්‍ය නිලායිනි ත්‍යාගේන්ද්‍රන් මහත්මිය ඊට මූල්‍ය දායකත්වය ලබාදෙනු ලැබුවාය.







# ගජසිංහපුර නව ළමා උද්‍යානය විවෘත කෙරේ





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ගේ සුරතින් ඉකුත් මැයි මස 21 වන දින ගජසිංහපුර නව ළමා උද්‍යානයක් විවෘත කෙරිණි. 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ මඟපෙන්වීම සහ 213 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් පීඑම් ද සිල්වා ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය මත එම බලසේනාවේ භටපිරිස් මෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූහ. මෙම වැඩසටහනට සමගාමීව, දරු දැරියන් 20 දෙනකු වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමක් ද සිදුකෙරිණි.





# නිවසට සෙවණක්

කදුරුවෙල ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව නිවසක් එම නිවාසලාභීන් වෙත භාරදීම ඉකුත් මැයි මස 28 වන දින ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. පරිත්‍යාගශීලීන්ගේ අනුග්‍රාහකත්වය මත 7 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ හටපිරිස්හි තාක්ෂණික දැනුම භාවිතා කරමින් මාස තුනක කාලසීමාවක් තුළ මෙම නිවස ඉදිකිරීම විශේෂත්වයකි. එහිදී නිවාසලාභී පවුලේ සාමාජිකයන් වෙත ආහාරපාන ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කෙරිණ.



# සිංහල භාෂා පුහුණු වැඩසටහනක්






විවිධ ජාතීන් අතර සංහිඳියාව ඇතිකිරීමේ අරමුණින් ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) වෙතින් මීට මාස කිහිපයකට ප්‍රථම කොක්කඩිචෝලෙයි රාමක්‍රිෂ්ණ මිෂන් පාසලේදී සිංහල භාෂා පුහුණු වැඩසටහනක් ආරම්භ කරනු ලැබීය. එහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේ අරමුණින් ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ඉකුත් මැයි මස 24 වන දින එම විද්‍යාලයේ සංචාරයක නිරතවිය. එම පුහුණු වැඩසටහන සඳහා මේ වනවිට දමිළ සිසු සිසුවියන් 103 දෙනකු සහභාගී වෙති. එම සිසු සිසුවියන් විසින් ගීත සහ දේශන මගින් ඔවුන්ගේ සිංහල භාෂා කුසලතාවයන් සංචාරයේ නිරත ආඥාපති වෙත ඉදිරිපත් කළහ. මෙම පාඨමාලාවේ ප්‍රධාන උපදේශක වශයෙන් එච්එම් අන්වර් මහතා කටයුතු කරයි.

එමෙන්ම, මඩකලපුව සිවිල් පුරවැසි කමිටුව වෙතින් සංවිධානය කරනු ලැබූ සිංහල භාෂා ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානෝත්සවය ඉකුත් මැයි මස 26 වන දින ඔඩ්ඩමාවඩි ජාතික පාසලේදී පැවැත්විණි. පාඨමාලාව සාර්ථකව නිමකළ සිසු සිසුවියන් 150 දෙනකුට එහිදී සිංහල භාෂාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකපත් පිරිනැමිණි. ඊට අමතරව, මේ වනවිට එම පාඨමාලාව හදාරන තවත් සිසු සිසුවියන් 220 දෙනකු වෙත පාඨමාලාව හා සබැඳි පෙළපොත් බෙදාදීමක් ද මෙහිදී සිදුකෙරිණි. මෙම අවස්ථාව සඳහා ද ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති සහභාගී විය.



# සංචාරයක මතක සටහන්

යුද්ධ හමුදා උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ඒකේ රාජපක්ෂ ආර්එස්පී ඉකුත් ජූනි මස 11 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සංචාරයක නිරත වූහ. මූලස්ථානය වෙත සපැමිණි එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, එහි ආඥාපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් ඉතා උණුසුම් ලෙස පිළිගනු ලැබීය. මෙහිදී, පාලන හා හරකාර්ය සම්පාදක කටයුතු සම්බන්ධ වැදගත් කරුණු සහ ගැටලු පිළිබඳව සාකච්ඡා කරමින් එම කටයුතු හා සම්බන්ධ නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අදහස් හුවමාරු කරගැනීමක් ද සිදුවිය.

# "Diners' Club" වැඩසටහන සාර්ථකව අවසන්



61 වන පාබල සේනාංකය වෙතින් සංවිධානය කළ 'Diners' Club' වැඩසටහනක් ඉකුත් මැයි මස 28 වන දින බූස්ස පාබල හමුදා උත්සව ශාලාවේදී පැවැත්විණ. ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති විසින් මෙම වැඩසටහනේදී "වෘත්තීයභාවය සහ බුද්ධිමත්භාවය තුළින් උපායමාර්ගික සංග්‍රාමික නායකත්වය" තේමාව ඔස්සේ දේශනයක් පැවැත්විය. මෙම අවස්ථාවට 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී, එම සේනාංකය යටතේ ඇති ඒකකයන්හි අණදෙන නිලධාරීන් ඇතුළු නිලධාරීන් 77 දෙනෙක් සහභාගී වූහ.





# සංචාරයක මතක සටහන්






ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඉකුත් ජූනි මස 06 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සංචාරයක නිරත විය. විද්‍යාපීඨයේ ප්‍රධාන දොරටුව වෙත සපැමිණි ආඥාපති වෙත කඳවුරු මුරයේ ගෞරවාචාරය පුදකිරීමෙන් අනතුරුව, එතුමන් මව්බිම වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන් සිහිපත් කරමින් එම විද්‍යාපීඨ රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර පුදකළේය. එහිදී විද්‍යාලයේ දෛනික කටයුතු හා පරිපාලන අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ හෙතෙම එහි කාර්ය මණ්ඩලය අමතන්නටද අමතක නොකළේය. මෙම සංචාරය සනිටුහන් කරමින් යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් ආඥාපති වෙත සමරු තිළිණයක්ද පිරිනමන ලදී.

## ඒකක සංචාරයක නිරතවෙමින්







යුදසේවා ලේකම් සහ ඉංජිනේරු සේවා බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් අයිඒඑන්බී පෙරේරා ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ඉකුත් ජූනි මස 22 වන දින 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සංචාරයක නිරතවන ලදී. එහිදී හමුදා සම්ප්‍රදායානුකූලව පිළිගත් කර්නල් සේනාවිධායක වෙත එම ඒකක අණදෙන නිලධාරී විසින් ඒකකයේ වගකීම්, කාර්යභාරය සහ මෑතකාලීන ලබාඇති ජයග්‍රහණ පිළිබඳ දැනුවත් කරන ලදී. සිය සංචාරයේදී නිලධාරීන් සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි කර්නල් සේනාවිධායක අනතුරුව තේපැන් සංග්‍රහයකට ද එක්විය. තවද, එහිදී හටපිරිස් ඇමතූ ඔහු ඔවුන්ගේ කැපවීම සහ වෘත්තීයභාවය ඇගයීමට ද ලක්කළේය. මෙම අවස්ථාවට ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් කේඑල් මුණසිංහ යූඑස්පී ඇතුළු එම ඒකක නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් දේශන මාලාවක්

යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් ගේ උපදෙස් හා මගපෙන්වීම මත රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් සංවිධානය කෙරෙන දේශන මාලාවේ තවත් අදියර තුනක් පසුගිය ජූනි 23, 26 සහ 27 යන තෙදින තුළදී පැවැත්විණ. ඒ යටතේ මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසල, 53 වන සේනාංකය හා අනුරාධපුර හෙද විද්‍යාලය යන ස්ථානයන්හි එම දේශන පැවැත්විණ.

එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම් මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කිරීමත් යුද අත්දැකීම් සහිතවූවන් තුළ අභිමානයක් ඇතිකරලීමත් පිණිස "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" පිළිබඳ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් සිදුකරන ලදී. තවද, හමුදා සාමාජිකයින්ගේ සමාජමාධ්‍ය භාවිතය, ආර්ථික කළමනාකරණය, නීතිවිරෝධී ක්‍රියාවලට සම්බන්ධවීම ආදී කරුණු අලලා "අභිමානවත් සොල්දාදුවා" යන මැයෙන් වූ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු මේජර් එම්එච්එම්එස් බණ්ඩාර විසින් සිදුකරන ලදී.





"අභිමානවත් සොල්දාදුවා" යන මැයෙන් මේජර් එම්එච්එම්එස් බණ්ඩාර විසින් ඉකුත් ජූනි මස 26 වන දින 53 වන පාබල සේනාංක මූලස්ථානයේදී පැවැත් වූ දේශනය





"යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" යන මැයෙන් ඉකුත් ජූනි මස 27 වන දින අනුරාධපුරය යුද හමුදා හෙද විද්‍යාලයේදී එහි පාඨමාලා හදාරන හෙද සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන් පැවති දේශනය



ඉකුත් ජූනි මස 23 වන දින මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ දී එහි සේනාවිධායකගේ ප්‍රධානත්වයෙන් හා නිලධාරීන්, සෙසුනිලයින් 400 කගේ සහභාගීත්වයෙන් පැවති "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" මැයෙන් වූ දේශනය



# පින්බර පොසොන් පොහොයට

## පුණ්‍ය වැඩසටහන් රැසක්...



කාලතුවක්කු බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්පී මලවරගේ ආර්එස්පී යූඑස්පී අයිජී ගේ අධීක්ෂණය මත ඉකුත් ජුනි මස 21 වන දින පොසොන් පොහොය නිමිත්තෙන් පොළොන්නරුව නගරයට පැමිණෙන බැතිමතුන් වෙනුවෙන් මින්නේරිය "ගනර්ස් ක්ලබ්" වෙළඳසැල ඉදිරිපිට දන්සැලක් පවත්වන ලදී. එම දන්සැලට පොල් රොටි, කොස් සහ තේ සංග්‍රහයන් ඇතුළත් විය.





සිංහ රෙජිමේන්තු සාමාජිකයින් විසින් පොසොන් පොහොය දින සන්ධ්‍යාවේ දී අඹේපුස්ස දුම්රිය ස්ථානය අසල දී බත් දන්සැලක් පවත්වන ලදී. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නෙලූකා නානායක්කාර මහත්මිය සහභාගී වූ අතර, එම ප්‍රදේශයේ පදිංචි පුද්ගලයින් 4500 කට ආසන්න පිරිසක් මෙම දන්සැලට සහභාගි වූහ.



පොසොන් පොහොය නිමිත්තෙන් 16 ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ගේ උපදෙස් පරිදි සංවිධානය කළ කිරිබත් දන්සැලක් පසුගිය ජුනි මස 21 වන දින කරුවලගස්වැව ගල්ලෙන රජමහා විහාරස්ථානයේදී පැවැත්විණ. එම අවස්ථාව සඳහා එම ඒකක නිලධාරීන්, සෙසුනිලයින් සහ ප්‍රදේශවාසීන් විශාල පිරිසක් සහභාගී වූහ.



පොසොන් පොහොය නිමිත්තෙන් 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් එම සේනාංකයේ හටපිරිස් විසින් සංවිධානය කළ බනිස් සහ තේ පැන් දන්සැලක් ඉකුත් ජුනි මස 21 වන දින කෙසෙල්හුඩුව කඳවුර අසලදී පැවැත්විණ.

# තැන තැන පොසොන් අසිරිය...








ඉකුත් ජුනි මස 21 වන දින පොසොන් පොහොය නිමිත්තෙන් සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ එම සේවා වනිතා ශාඛා සභාපතිනි ගංගා හේරත් මහත්මියගේ ප්‍රධානත්වයෙන් මහනුවර ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයේදී සව් දන්සැලක් පවත්වනු ලැබූහ. මල්වතු පාර්ශ්වයේ උප විහාරාධිපති අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි හිමියන් සමඟින් බුවැලිකඩ බෝධිරුක්ඛාරාම විහාරයේ පූජ්‍ය සීලරතන හිමියන් විසින් දන්සැල විවෘත කරනු ලැබූහ. ශ්‍රී දළදා වහන්සේ වැඳපුදා ගැනීම සඳහා දිවයිනේ නන් දෙසින් පැමිණි බෞද්ධ බැතිමතුන්ගේ පිපාසය සංසිඳුවාලීමේ අරමුණින් මෙම සව් දන්සැල සංවිධානය කරන ලදී.



24 වන පාබල සේනාංකයේ හටපිරිස් ඉකුත් ජුනි මස 19 වන දින පොසොන් පොහෝ දිනට සමගාමීව "බුද්ධංගල විහාරස්ථානයේ" විහාර භූමියේ ගොඩගැසී ඇති අපද්‍රව්‍ය සහ කුණු ඉවත් කිරීමේ අරමුණින් ප්‍රජා ව්‍යාපෘතියක් සිදුකරනු ලැබූහ. එහිදී, බැතිමතුන් හට විහාරස්ථානය වන්දනාමාන කිරීමට සහ භාවනා කිරීමට හැකිවන පරිදි විහාර භූමිය මනරම් ලෙස සකස් කෙරිණ.



පොසොන් පොහොය දිනට සමගාමීව පුරෝගාමී බලකා සේවා වනිතා ශාඛාව වෙතින් 1 පුරෝගාමී බලකාය අවට ප්‍රදේශවාසීන් සඳහා කොස් දන්සැලක් එම කඳවුරු පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම අවස්ථාවට එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ආර්පීසීඑන් පියතිස්ස අයිඑස්සී ඇතුළු එම බලකා සාමාජිකයෝ රැසක් සහභාගී වූහ.

පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වජීරා පෙරේරා මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගිය පොසොන් පොහොය දින මඤ්ඤොක්කා දන්සැලක් පනාගොඩ සිල්වර් බියුගල් ආපන ශාලාව අසලදී පැවැත්විණ. එම පුණ්‍ය කටයුත්ත සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ, පාබල හමුදා සාමාජිකයෝ ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.





# පින්බර පොසොන් පොහොයට

## පුණ්‍ය වැඩසටහන් රැසක්...





යාපනය ශික්‍ෂණ රෝහලේ අක්ෂි රෝග ඒකකය විසින් ඉකුත් පොසොන් පොහොය දින බත් දන්සැලක් සංවිධානය කරන ලදී. යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඒම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්ඒම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම දන්සැල සඳහා එම රෝහලේ විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍ය එම්. මලරාවන් මහතා, උතුරු පළාත් ප්‍රධාන ලේකම් ඇතුළු සම්භාවනීය අමුත්තන් සහ රෝහල් කාර්යය මණ්ඩලය සහභාගී වූහ.





12 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් එච්එම්වීපී හේරත් ගේ අධීක්ෂණය මත පොසොන් පොහොය දිනට සමගාමීව පාසල් සිසුන් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් ඉකුත් ජුනි මස 18 වන දින කිරාන් මුරුථාන ශ්‍රී මුරුගන් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. යුද්ධ හමුදාව සහ මහජනතාව අතර සංහිඳියාව ඇති කිරීමේ අරමුණින් මෙම සමාජ සත්කාරක වැඩසටහන සංවිධානය කෙරිණ. මෙම ප්‍රජා වැඩසටහන සඳහා කිරාන් මුරුථාන ශ්‍රී මුරුගන් විද්‍යාලයේ සහ පොණ්ඩුකච්චේන ගණපති විද්‍යාලයේ සිසුසිසුවියන්,ගුරුවරුන් හා දෙමාපියන් ඇතුළු ප්‍රදේශවාසීන් 450 පිරිසක් සහභාගී වූහ. මෙම අවස්ථාවට 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පී කාරියවසම්, යුද්ධ හමුදා සාමාජිකයින්, පොලිස් නිලධාරීන් සහ විදුහල්පතිවරු ඇතුළු පිරිසක් ද එක්වූහ.





ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හටපිරිස් විසින් පොසොන් පොහොය දිනය යෙදී තිබූ ජුනි මස 21 වන දින වැලිකන්ද නගරයේදී කොස්, කඩල සහ මඤ්ඤොක්කා දන්සැලක් පවත්වනු ලැබීය. මෙම දන්සැල සඳහා ප්‍රදේශවාසීන් විශාල පිරිසක් සහභාගී වූ අතර, එහිදී ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හටපිරිස් විසින් නිර්මාණය කරන ලද අලංකාරවත් පොසොන් පහන් කූඩු රැසක් ද ප්‍රදර්ශනය කරනු ලැබීය.





පොසොන් පොහොය දිනය නිමිත්තෙන් 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මගපෙන්වීම යටතේ එම සේනාංක හටපිරිස් ධර්ම දේශනා වැඩසටහනක් සංවිධානය කරනු ලැබූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ද සහභාගී විය. එහිදී, යාපනය ශ්‍රී නාගවිහාරයේ විහාරාධිපති පූජ්‍ය මීගහජඳුරේ සිරිවිමල හිමි, කොන්ඩාවිල් පලනියන්ඩි හින්දු කෝවිලේ ප්‍රධාන කුරුක්කල් රවි පූජකතුමන්, යාපනය විශ්වවිද්‍යාලයේ අධ්‍යාත්මික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මැක්ඩොනල්ඩ් පියතුමන් පැමිණ සිටි පිරිස අමතමින් සංහිඳියාවේ සහ එකමුතුකමේ වටිනාකම පිළිබඳ අවධාරණය කළහ. ධර්ම දේශන මාලාව අවසානයේ ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) විසින් එහි *'CIMIC'* උද්‍යාන පරිශ්‍රයේදී බත් දන්සැලක්ද පවත්වනු ලැබීය.





පොසොන් පොහොය දිනට සමගාමීව ඉකුත් ජූනි මස 21 වන දින සිට 23 වන දින දක්වා බුද්ධංගල විහාරස්ථාන පරිශ්‍රයේදී ධාතුන් වහන්සේලා ප්‍රදර්ශනයක් පැවැත්විණ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මගපෙන්වීම යටතේ 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීසී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණයෙන් මෙම පුන්‍යකර්මය සංවිධානය කෙරිණ. එම ප්‍රදර්ශනය අතරතුර වැඩම කර සිටි මහා සංඝරත්නය උදෙසා දානය පිරිනැමූ අතර, පිංකම වෙනුවෙන් විහාරස්ථානයට පැමිණි බැතිමතුන් සඳහා සිසිල් බීම දන්සැලක් ද සංවිධානය කර තිබුණි.



පසුගිය පොසොන් පොහොය වෙනුවෙන් 4 ගැමුණු හේවා බලකාය විසින් උන්නච්චිය වැව පරිශ්‍රයේදී බත් දන්සැලක් සංවිධානය කරන ලදී. ප්‍රදේශවාසීන් විශාල පිරිසක් ඒ සඳහා පැමිණියේය.



පොසොන් පොහෝ දිනට සමගාමීව 14 විජයබාහු පාබල රෙජිමේන්තු හටපිරිස් ඉකුත් ජූනි මස 17 වන දින බොරැල්ල, ලෙස්ලි රණගල මාවතේ පිහිටි වැඩිහිටි නිවාසය පිරිසිදු කිරීමේ සත්කාරයක් ක්‍රියාත්මක කරනු ලැබූහ.



# පින්බර පොසොන් පොහොයට
## පුණ්‍ය වැඩසටහන් රැසක්...





පොසොන් දිනය සහ මහින්දාගමනයේ වැදගත්කම සංකේතවත් කරමින් 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත ඉකුත් ජූනි මස 21 වන දින අම්පාර නගරයේ පොසොන් කලාපයක් පැවැත්විණ. තවද, ඓතිහාසික දීඝවාපිය සෑය අභියස ආලෝක පූජාවක් ද, අම්පාර මහාවාපිය විහාරස්ථානයේ දී බුදුරජාණන් වහන්සේගේ සර්වඥ කේශ ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනයක් ද පැවැත්විණ. එමෙන්ම, සේනාංකාධිපතිගේ මගපෙන්වීම යටතේ බැතිමතුන් සහ යුද්ධ හමුදා සාමාජිකයින් එක්ව කිරි ආහාර පූජා උත්සවයක් ද පවත්වන ලදී.





සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛා සභාපතිනියගේ උපදෙස් මත පොසොන් පොහොය නිමිත්තෙන් කරන්දෙණිය ප්‍රදේශවාසීන් හට ඉකුත් ජූනි මස 21 වන දින මස්සොක්කා දන්සැලක් පවත්වන ලදී. ඒ සඳහා ප්‍රදේශවාසීන් 1500 ක් පමණ සහභාගී වූහ.



ඉකුත් මැයි මස 23 වන දිනට යෙදී තිබූ වෙසක් පොහොය දිනය නිමිත්තෙන් වේයන්ගොඩ පිහිටි යුද්ධ හමුදා රෙදිපිළි ගබඩාවේ සේනාවිධායකගේ මගපෙන්වීමෙන් එම කඳවුර ඉදිරිපිටදී කොස් දන්සැලක් පවත්වන ලදී.



පොසොන් පොහෝ දිනය නිමිත්තෙන් 611 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එච්ඩීඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ උපදෙස් මත එම බලසේනාවේ හටපිරිස් විසින් පසුගිය ජූනි මස 21 වන දින "මස්සොක්කා දන්සැලක්" පවත්වන ලද අතර, ඒ සඳහා බැතිමතුන් විශාල පිරිසක් සහභාගී වූහ.

# ඒකක සංචාරයක නිරත වෙමින්




112 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් කේඩීආර් කලුපහන ආර්එස්පී යූඑස්පී ඉකුත් ජුනි මස 11 වන දින 19 බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවෙහි සංචාරයක නිරත විය. එහිදී, ඒකකයේ පාලන කටයුතු පිළිබඳ සොයාබැලූ හෙතෙම එහි නිලධාරීන් සමඟ සාකච්ඡාවක ද නිරතවූහ.

# භෝජනාගාර ගිණුම් තැබීමේ පාඨමාලාවක්




53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ මඟපෙන්වීමෙන් එම සේනාංකයෙහි රාජකාරී නියුතු ජ්‍යෙකොනොනීන් සහ කොනොනීන්ගේ සහභාගීත්වයෙන් භෝජනාගාර ගිණුම් තැබීමේ දැනුම වර්ධනය කිරීම සඳහා දින 10 ක වැඩමුළුවක් පසුගිය මැයි මස 06 සිට මැයි 17 වන දින දක්වා පැවැත්විණ. ඒ සඳහා ජ්‍යෙකොනොනීන් සහ කොනොනීන් 31 දෙනකු සහභාගී වූහ.

# වෛද්‍ය පාඨමාලාවක්





54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මඟපෙන්වීමෙන් එම සේනාංකය යටතේ ස්ථාපිත 541 වන පාබල බලසේනාවේ සේවයේ නියතු හටපිරිස් වෙනුවෙන් සංවිධානය කෙරුණු මූලික වෛද්‍ය පාඨමාලාවක් ඉකුත් මැයි මස 06 සිට 11 වන දින දක්වා පැවැත්විණ.

සෙසුනිලයින් 40 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවැත්වූ මෙම පාඨමාලාව ප්‍රථමාධාර, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ සර්පයන් හැසිරවීම පිළිබඳව කරුණු අන්තර්ගත විය. පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 541 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් බීවයිසී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී යූඑස්පී සහභාගි විය. වෛද්‍ය ලූතිනන් එස්එල්වයිජී කුමාර, පල්ලේමඩු ආයුර්වේද රෝහලේ ආයුර්වේද වෛද්‍ය පීඒ ප්‍රනාන්දු, සැරයන් කුමාර එම්ජීඑන්ජී සහ සැරයන් අබේසිංහ බීඒඑම්ජීඑස්අයිආර්කේ මෙම පාඨමාලාව මෙහෙයවනු ලැබූහ.

# විශේෂ බලකා ප්‍රවීණයන්ගේ මහ සභා රැස්වීම






ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකා ප්‍රවීණයන්ගේ සංගමයේ 4 වැනි වාර්ෂික මහා සභා රැස්වීම කුරුණෑගල, *"Kroll Village"* හෝටල් පරිශ්‍රයේදී ඉකුත් ජූනි මස 22 වන දින එම බලකා ප්‍රවීණයන් 185 දෙනෙක්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණ. මෙම අවස්ථාවට හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක (විශ්‍රාමික), විශේෂ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, කර්නල් ජයවි ප්‍රනාන්දු (විශ්‍රාමික) ප්‍රධානත්වය දැරූහ. උත්සවය අතරතුර, 2024-2025 වර්ෂය සඳහා නව තනතුරු තෝරා පත්කර ගැනීමත්, විශේෂ බලකා රෙජිමේන්තුව වෙත සිදුකරනු ලැබූ දායකත්වය අගයමින් එහි සපැමිණි හිටපු යුද්ධ හමුදාධිපති වෙත පූර්ණ කාලීන සාමාජිකත්වය පිරිනැමීමත් එදින උත්සව කටයුතු අතර ප්‍රධාන විය. සැබැවින්ම එය රට වෙනුවෙන් මහගු මෙහෙවරක් ඉටුකළ අති විශිෂ්ට රෙජිමේන්තුවක විශ්‍රාමික රණකාමී විරුවන්ගේ කදිම හමුවකි.

# නිල ලාංඡන පැළඳීමේ උත්සවයට එක්වෙමින්






මහනුවර ස්වර්ණමාලි බාලිකා විද්‍යාලයේ 2024 වර්ෂය සඳහා නව ශිෂ්‍ය නායිකාවන් වෙනුවෙන් නිල ලාංඡන පැළඳවීමේ උත්සවයක් ඉකුත් ජූනි 25 වන දින එම විදුහල් පරිශ්‍රයේ පැවැත්විණ. එම අවස්ථාවට 11 පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.

# ජල අවශ්‍යතාවය සපුරාලීමට මුල්වෙමින්





පොසොන් උත්සවය නිමිත්තෙන් 20 සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ එම ඒකක භටපිරිස් විසින් සෙල්ලකතරගම, ගෝනමීගම ප්‍රදේශයේ ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දිවි ගෙවන පවුලක් සඳහා ජල අවශ්‍යතා වෙනුවෙන් ඉදිකරදුන් ළිඳක් එම ප්‍රතිලාභීන් වෙත පසුගියදා භාරදෙන ලදී. වතුරාව රජමහා විහාරාධිපති දෙනගම ධම්මරතන හිමියන්ගේ මූලිකත්වයෙන් මෙම කටයුතු ආරම්භ කරනු ලැබූ අතර, 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ සම්බන්ධීකරණයෙන් "සෙත් සදන මග සමාජ සත්කාර" සංවිධානයේ නිර්මාතෘ සහ සභාපති රජිත් තෙන්නකෝන් මහතාගේ මූල්‍යමය දායකත්වය මත මෙම ව්‍යාපෘතිය සිදුකරනු ලැබිණි.

# සිතට සවියක් හිසට සෙවණක්




පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ පදිංචි නිවාස අවශ්‍ය පවුලක් වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව නිවසක් 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි මස 02 වන දින එම නිවාසලාභීන් වෙත පවරාදෙනු ලැබීය. 'Lift Life Foundation' හි අනුග්‍රාහකත්වය යටතේ 593 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ උපදෙස් මත 6 ගැමුණු හේවා බලකායේ භටපිරිස් විසින් දින 10 ක් ඇතුළත මෙම නිවස ඉදිකරදීම විශේෂත්වයකි. උත්සව අවස්ථාවේදී, තේරාවිල් වැව පිටාර ගැලීමෙන් ඇති වූ ගංවතුර තත්ත්වයෙන් විපතට පත් පවුල් වෙනුවෙන් ඔවුන්ගේ නිවෙස් පිරිසිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය සනීපාරක්ෂක උපකරණ ලබාදීමක් ද සිදුකරනු ලැබීය.

# අවැසි මොහොතේ සහායක්




ඉකුත් මැයි මස 25 වන දින සවස කන්කසන්තුරේ සිට අනුරාධපුරය බලා ධාවනය වෙමින් තිබූ මගී දුම්රියක් වනඅලි රංචුවක ගැටීමක් සිදුවිය. එහිදී, 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ උපදෙස් මත 561 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්ෂණයෙන් එම පාබල බලසේනාවේ සහ 16 සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් කණ්ඩායම් දෙකක්, වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ දුම්රිය නිලධාරීන් සමග එක්ව ක්ෂණික ගලවාගැනීමේ මෙහෙයුමක් දියත් කළහ. දුම්රිය මගීන්ගේ ආරක්ෂාව සහතික කරමින්, අවශ්‍ය සහාය ලබාදී තුවාල වූ සතුන් හට කඩිනම් වෛද්‍ය ප්‍රතිකාර සහ රැකවරණය ලබාදීම සිදුකෙරිණ. අවසානයේ පැය 10 කට ආසන්න කාලයක් තුළදී සුන්බුන් ඉවත්කර, හානියට පත් දුම්රිය මාර්ගය සකස් කිරීමට ද සෙබළු ක්‍රියාකළහ.

# මාහැඟි සත්කාරයකට මුල්වෙමින්




රිය අනතුරකට ලක්ව ඉනෙන් පහළ අප්‍රාණිකව සිටින අංක 1007/1, උඩුගම් කොටස, කිතුල්හිටියාව යන ලිපිනයෙහි පදිංචි ඩීඑම් රෝහණ බංඩාර යන අයට රෝද පුටුවක් ආධාරයෙන් ගමන්කළ හැකිවන පරිදි වැසිකිලියක් සකස්කර භාරදීමට 53 වන පාබල සේනාංක භටපිරිස් කටයුතු කළහ. එම පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ අධීක්ෂණය මත ඒ යටතේ ඇති බලසේනා, ඒකක සහ පුහුණු පාසල් වෙතින් ලබාගත් මූල්‍ය සහ ද්‍රව්‍යමය ආධාර මත මෙම ප්‍රජාසත්කාරය සිදුකෙරිණ.

# ගර්භනී මව්වරුන්ට පරිත්‍යාගයක්





වව්නියාව ප්‍රදේශයේ ගර්භනී මව්වරුන් සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ළදරු අවශ්‍යතා තොගයක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 23 වන දින ඕමන්ත මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්විණ. ඕෂධී අතුකෝරළ මෙනවියගේ මූල්‍ය අනුග්‍රහය මත 563 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලුතිනන් කර්නල් ඩීආර් තාරුකරත්න ගේ සම්බන්ධීකරණයෙන් එහිදී ගැබිණි කාන්තාවන් 20 දෙනකු අතර එම අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීම සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී එක්විය.

# අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු සංචාරයක නිරතවෙයි



යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ජූනි මස 05 වන දින යුද්ධ හමුදා පුහුණු පාසල මාදුරුඔය නිල සංචාරයක නිරත විය. එහිදී මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩියූ පීඑස්සී විසින් ඔහුව උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව එම පුහුණු පාසලේ කාර්යභාරය සහ පුහුණු වැඩසටහන් පිළිබඳව විස්තරයක්ද ඉදිරිපත් කළේය. අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු එම පුහුණු පාසලේ මාණ්ඩලික නිලධාරීන් සහ උපදේශකයන් ඇමතීමෙන් අනතුරුව, සේනාවිධායක සමගින් කඳවුරු පරිශ්‍රයේ නිරීක්ෂණ සංචාරයක නිරත වන්නටද අමතක නොකළේය.

# මුයිනායි ආත්මාරක්ෂක සටන් කලා වර්ධනය කිරීමේ පාඨමාලාවක්





යුද්ධ හමුදා විශේෂ බලකායේ බලකාධිපති සහ 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ උපදෙස් හා විශේෂ බලකා බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩීඑස් හොරවලවිතාන ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය මත එම බලකා භටපිරිස් වෙනුවෙන් මුයිනායි ආත්මාරක්ෂක සටන් කලාව වර්ධනය කිරීමේ පාඨමාලාවක් පසුගිය දා පවත්වනු ලැබිය.

මෙම පුහුණු පාඨමාලාව ඉකුත් මැයි මස 13 වන දින සිට ජූනි මස 03 වන දින දක්වා 3 විශේෂ බලකා මූලස්ථානයේදී පැවැත්වුණු අතර, ඒ සඳහා විශේෂ බලකා සාමාජිකයෝ 44 දෙනෙක් සහභාගී වූහ. යුද්ධ හමුදා මුයිනායි කමිටුවේ උප සභාපති කර්නල් පීපීසී පෙරේරා පීඑස්සී ගේ උපදෙස් මත හත්දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් මෙම පාඨමාලාවේ උපදේශකයන් වශයෙන් කටයුතු කළහ. මෙම පාඨමාලාව, එම බලකා සාමාජිකයන්ගේ ආත්මාරක්ෂක සටන් හැකියාවන් වැඩිදියුණු කිරීම, ආත්මාරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය දැනුම සහ උපායමාර්ගික ක්‍රමෝපායන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් පැවැත්විණි.

# 61 වන පාබල සේනාංකයේ අභිමානවත් සංවත්සරය සමරමින්





61 වන පාබල සේනාංකයේ 16 වන සංවත්සය එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, සේනාංකාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාලියක් පැවැත්වීම, සියලු නිල තේපැන් සංග්‍රහය, සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් පැවති ක්‍රිකට් තරගාවලිය සහ රත්ගම විජේරත්න වැඩිහිටි නිවාසයේ නේවාසික වැඩිහිටියන් වෙනුවෙන් පැවති ප්‍රණීත දිවා භෝජන සංග්‍රහය සංවත්සර දිනයේ වැඩසටහන් අතර කැපීපෙනුණි.

# කෙඩෙට් නිලධාරීන් යාපනය ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක





ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ කෙඩෙට් නිලධාරීන් පිරිසක් ඉකුත් මැයි මස 30 සහ 31 යන දිනයන්හි ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) හා එම බලප්‍රදේශයේ සංචාරයක නිරතවූහ. මෙම සංචාරයේදී තල් සෙවණ නිවාඩු නිකේතනය, යාපනය නගරය, යාපනය කොටුව, පුස්තකාලය, ජෙනරාල් කොබ්බෑකඩුව අනුස්මරණ ස්ථානය, දඹකොළ පටුන, සංගුපිටිය පාලම සහ රණවිරු ස්මාරකය යන ස්ථාන ඔවුන්ගේ නිරීක්ෂණයට බඳුන්විය.



කෙන්යාව, සැම්බියාව සහ උගන්ඩාව නියෝජනය කරමින් කෙඩෙට් නිලධාරීන් 10 ක්ද, 92A, 93B සහ SC21 කෙඩෙට් පාඨමාලාවන්හි කෙඩෙට් නිලධාරීන් 227 දෙනකු සමග උපදේශක නිලධාරීන් හා සෙසුනිල උපදේශකයෝ පිරිසක්ද ඊට සහභාගී වූහ. එහිදී, යාපනය අර්ධද්වීපයේ ඉතිහාසය, සංවර්ධනය, කාර්යභාරය සහ සිවිල් ප්‍රජාව සඳහා යුද්ධ හමුදාව වෙතින් සිදුකරන ලද වැඩසටහන් හා ආධාර පිළිබඳ ඔවුන්ව දැනුවත් කෙරිණ.





# මුස්ලිම් ප්‍රජාව සමඟ සුහදත්වය වර්ධනය කෙරේ





24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්ඒසී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පසුගියදා කාත්තන්කුඩියේ මුස්ලිම් ප්‍රජාව සමඟ සුහද සාකච්ඡාවක නිරත වූහ. එහිදී කාත්තන්කුඩි මුස්ලිම් කමිටුවේ ලේකම් මව්ලවි ඉල්හාම් විසින් ඔවුන් කාත්තන්කුඩි ප්‍රදේශයේ සමාජය වෙනුවෙන් ඉටුකරන කාර්යභාරය, ප්‍රදේශයේ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් සහ භාවිතය පිළිබඳව කෙටි දැනුවත් කිරීමක් සිදුකරන ලදී. රට තුළ සාමයෙන් සහ සහජීවනයෙන් ජීවත්වීමේ වටිනාකම මුස්ලිම් කමිටුව හමුවේ අවධාරණය කළ සේනාංකාධිපති, සියලු ජාතීන් එකම ප්‍රජාවක් ලෙස ජීවත් වියයුතු බව තවදුරටත් අවධාරණය කළේය. 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, කර්නල් ප්‍රධාන මාණ්ඩලික, 243 පාබල බළසේමු සිවිල් සම්බන්ධීකරණ නිලධාරී සහ 11 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

# ඉගෙනුමට අත්වැලක්





අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල, දමිළ හා මුස්ලිම් සිසු දරු දැරියන් ඉගෙනුම ලබන එකම සිංහල පාසල වන අක්කරපත්තුව ප්‍රදේශයේ පිහිටි අම්පාර ධම්මරතන සිංහල විද්‍යාලයේ නාට්‍ය හා රංගකලාව හැදෑරීම සඳහා යොදාගන්නා පාවිච්චියට නුසුදුසු තත්වයේ තිබූ වාද්‍ය භාණ්ඩ නැවත අලුත්වැඩියා කර භාරදීම පසුගියදා 241 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් එල්එස්ඩීඑන් පතිරත්න ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. එම පාසලේ විදුහල්පතිතුමා විසින් බලසේනාධිපතිගෙන් සිදුකරන ලද ඉල්ලීමකට අනුව මාතර පිහිටි ප්‍රසිද්ධ සංගීත භාණ්ඩ නිෂ්පාදන ආයතනයක් වන ශ්‍රී මධුර ආයතනයේ අධිපති තුමා විසින් ගාස්තු අය කිරීමකින් තොරව එම භාණ්ඩ අලුත්වැඩියා කරදෙන ලදී. මෙහි සම්බන්ධීකරණය කටයුතු 241 පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී විසින් සිදුකරන ලද අතර, අදාළ සංගීත භාණ්ඩ සිසු දරු දැරියන් වෙත ලබාදීමේ අවස්ථාවට 241 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, විදුහලේ විදුහල්පති, ආචාර්ය මණ්ඩලය හා ශ්‍රී විජයාරාම මහා විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# නව නිවහනක් පරිත්‍යාග කෙරේ





75 වන යුද්ධ හමුදා දින සැමරුමට සමගාමීව 4 ගැමුණු හේවා බලකායේ හටපිරිස් කෝච්තෝට්ටම්, පෙරියපිල්ලුමලේ ප්‍රදේශයේ වෙසෙන නිවාස අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් නව නිවසක් ඉදිකරදෙනු ලැබූහ. 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පී කාරියවසම් ගේ අධීක්ෂණය මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීය. නව නිවස විවෘත කිරීමේ උත්සවය ඉකුත් ජූනි මස 05 වන දින පැවති අතර එහිදී, 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ සුරතින් නිවාසලාභියා වෙත නව නිවසේ යතුරු ප්‍රදානය කෙරිණ.

## අධ්‍යාත්මික සංවර්ධනයට භාවනා වැඩසටහනක්



යුද්ධ හමුදා සාමාජිකයින් තුළ අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීමත් ජාතිය වෙනුවෙන් දැඩි කැපවීමෙන් සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමට පෙළඹවීම හරහා ඔවුන් තුළ මානසික සෞඛ්‍ය නැංවීමත් අරමුණු කරගනිමින් සංවිධානය කෙරුණු භාවනා වැඩසටහනක් පසුගිය ජුනි මස 01 වන දින 56 වන පාබල සේනාංක පරිශ්‍රයේදී පැවැත්විණ. එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීමෙන් මෙම කටයුත්ත සිදුවිය.

## නිවාස සිහිනය සැබෑ කරමින්





පොලොන්නරු දිස්ත්‍රික්කයේ කුඩාවැව ග්‍රාමයේ පදිංචි දිනූෂා රුක්මාලි මහත්මිය වෙත නව නිවසක් ඉදිකර භාරදීම පසුගිය ජුනි මස 09 වන දින 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. පරිත්‍යාගශීලීන්ගේ භාණ්ඩ හා මූල්‍යාධාර සමගින් 19 ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී මේජර් බීජ්කේඅයිකේ බෝගොඩ ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ මගපෙන්වීම මත එම ඒකකයේ සියලු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් මෙහි ඉදිකිරීම් කටයුතු සිදුකෙරිණ. මෙම අවස්ථාවට 532 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, මනම්පිටිය පොලිස් ස්ථානාධිපති, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් සහ පරිත්‍යාගශීලී භවතුන් සහභාගී වූහ.

## පෙර පාසල් සිසුනට දිවා ආහාර වේලක්





සිංහල සහ දමිළ සිසුන් අධ්‍යාපනය ලබන නාවට්කුලි ලක්දරු පෙරපාසලේ සිසුන් සඳහා ඉකුත් ජුනි 14 වන දින රසවත් දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමිණ. 11 ඉංජිනේරු බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් කේජීසීකේ කුඩාගමගේ ගේ සහ එම බලකා භටපිරිස්හි සහභාගීත්වයෙන් සිදුකළ මෙම සත්ක්‍රියාව එම පෙරපාසලේ ගුරුවරුන් සහ දෙමව්පියන්ගේ මහත් ඇගයීමට ද ලක්විය. නාවට්කුලි ලක්දරු පෙර පාසල එම ප්‍රදේශයේ ඇති එකම මිශ්‍ර පෙර පාසල වේ.

# නව මුරහල සහ පිවිසුම් දොරටුව විවෘත කෙරේ




1 රයිෆල් බලකායේ නවතමයෙන් ඉදිකරන ලද මුරහල සහ පිවිසුම් දොරටුව 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි මස 25 වන දින විවෘත කරනු ලැබීය. මෙම අවස්ථාවට එම ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

# අභිමානවත් 36 වන සංවත්සරය සමරමින්





කොස්ගම, සාලාව ප්‍රදේශයේ ස්ථාපිත 1 සංඥා බලසේනාවේ අභිමානවත් 36 වන සංවත්සරය නිමිත්තෙන් එම බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් පීඩබ්ලිව්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම මත ඉකුත් ජූනි මස 01 වන දින සැමරුම් උත්සවයක් පැවැත්විණි. එහිදී ප්‍රධාන දොරටුව අසල ඉදිකරනු ලැබූ 1 සංඥා බලසේනාවේ නාම පුවරුව විවෘත කිරීම, සියලු නිල තේ පැන් සංග්‍රහය ඇතුළු වැඩසටහන් රැසක් පැවැත්විණ. මෙම අවස්ථාවට එම බලසේනාවේ නිලධාරීන් සහ සෙසුනිලයෝ රැසක් එක්වූහ.

# නව සෙවණකට මුල්ගල තබමින්




නුනාවිල් ප්‍රදේශයේ වෙසෙන නිවාස අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් නව නිවසක් ඉදිකරදීම සඳහා මුල්ගල තැබීම ඉකුත් මැයි මස 22 වන දින 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. 523 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ අධීක්ෂණය මත 11 කාරක ඉංජිනේරු බලකායේ භටපිරිස් විසින් මෙම නව නිවසේ ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද අතර, ඒ සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ඕස්ට්‍රේලියාවේ Imaging International Compassion පුද්ගලික සමාගමේ පරිත්‍යාගශීලීන් විසින් දරනු ලබති. මෙම අවස්ථාව සඳහා පරිත්‍යාගශීලීන්, ක්‍රිස්තියානි ආගමික නායක ඒ. අරුල් මහතා සහ එම ආගමික නායකයින්, හමුදා සාමාජිකයින්, නිවාසලාභී පවුලේ සාමාජිකයින් සහ ප්‍රදේශවාසීහු පිරිසක් එක්වූහ.

# යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයෙන් පරිත්‍යාග රැසක්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මාසික මහසභා රැස්වීම එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි මස 18 වන දින පැවැත්විණ. එහිදී රණවිරු සුභසාධනය උදෙසා පරිත්‍යාග රැසක්ද සිදු කෙරිණ. ඒ යටතේ යුද්ධ හමුදා පොදු සේවා බලකායේ සේවයේ නියුතු සාමාජිකයින් සිව්දෙනකුගේ නිවාසවල ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් ලක්ෂ 06 බැගින් වූ මූල්‍ය ප්‍රදානයක්ද, අර්ධ වශයෙන් ඉදිකරනු ලැබූ නිවාසයන්හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරගැනීම සඳහා තවත් සෙබළුන් පස්දෙනකු වෙත රුපියල් 450,000.00 බැගින් ද සිවිල් සේවක මහතකු වෙත රුපියල් 200,000.00 බැගින් ද මූල්‍ය ප්‍රදානයන් පිරිනැමීය.






තවද යුද්ධ හමුදා සාමාජිකයකුගේ මන්දපෝෂණයෙන් පෙලෙන තම තුන් නිවුන් දරුවන් වෙත වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට සහ තවත් සෙබලකුගේ දෘෂ්‍යාබාධිත දියණියට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා රුපියල් 75,000.00 බැගින් වූ මූල්‍ය ප්‍රදානයක් ද දරුවන් තිදෙනකු සිටින යුද්ධ හමුදා පොදු සේවා බලකා සාමාජිකයින් තිදෙනකුගේ පවුල් සඳහා දිරිදීමනා වශයෙන් රුපියල් 100,000.00 බැගින් ද ප්‍රදානය කරනු ලැබීය. එමෙන්ම, තවත් පිරිසකට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා පාසල් උපකරණ ප්‍රදානයන්ද මෙම අවස්ථාවට සමගාමීව සිදුකෙරිණ.






# වියළි සළාක පරිත්‍යාගයක්





ආරක්ෂක සේනා යාපනය, නැගෙනහිර, වන්නි සහ මධ්‍යම බලප්‍රදේශ තුළ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් 400 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි මස 10 සහ 12 යන දෙදින තුළ යුද්ධ හමුදා මූලස්ථාන සේවා වනිතා කාර්යාලයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තිය ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය.



# මහසභා රැස්වීමට සමගාමීව ප්‍රජාසත්කාරයක්





ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහසභා රැස්වීම පසුගිය ජූනි මස 08 වන දින කුරුණෑගල ස්ථාපිත ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය.

මෙයට සමගාමීව සභාපතිනිය විසින් විශේෂ අවශ්‍යතා සහිත එම රෙජිමේන්තු සාමාජිකයකුගේ දරුවකු වෙනුවෙන් රෝද පුටුවක් ද පරිත්‍යාග කරනු ලැබුවාය. මේ සඳහා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් ද එහි මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ජ් කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී ද එක්වූහ.

# දෙවසරක ගමන්මඟ වෙනුවෙන් වැඩසටහන් රැසක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සිය තනතුරේ වැඩ භාරගෙන වසර දෙකක් සපිරීම නිමිත්තෙන් වැඩසටහන් මාලාවක් ඉකුත් ජූනි මස 03 වන දින එම ඒකක කාර්යාලයේදී පැවැත්විණ.

තුනුරුවනේ ආශිර්වාද ලබාගැනීමෙන් පසු යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ රාජකාරී කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින් වෙත වියලි සළාක මළු බෙදාදීමක් එහිදී සිදුකෙරිණ. තවද, කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව විසින් දැඩි සත්කාර ඒකකයන්හි භාවිතා කරනු ලබන ඇඳන් 04 ක් නාරාහේන්පිට පිහිටි යුද්ධ හමුදා රෝහල වෙත පරිත්‍යාග කිරීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනිය වෙත පිරිනැමීම ද එහිදී සිදුවිය.







රණක්ෂිතයට පත්

# විරුවන්ගේ සුවදුක් සොයාබැලේ





අභිමංසල *I, II III* සහ මිහිඳු සෙත් මැඳුරෙහි නේවාසික ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන් සහ ඔවුන්ට උපස්ථානය කරනු ලබන අයවළුන් 125 දෙනකු සඳහා ඔවුන්ගේ පවුල්වල ජීවන තත්ත්වයට යම් සහනයක් ලබාදීමේ අරමුණින් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි මස 07 වන දින අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරේදී පැවැත්විණ.

එහිදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනිය මිහිඳු සෙත් මැඳුරෙහි නේවාසික වාට්ටු වෙත ගොස් රණවිරුවන් සමග සුහද කතාබහක නිරතවෙමින් ඔවුන්ගේ අවශ්‍යතාවයන් සහ පවුලේ සාමාජිකයින්ගේ ගැටළු පිළිබඳ කරුණු විමසන්නටද අමතක නොකළාය. ඉන්පසු එම රණවිරුවන් සඳහා දිවා භෝජන සංග්‍රහයක් ද පිරිනමන ලදී. මෙහිදී මිහිඳු සෙත් මැඳුරෙහි රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකොට ඇති පිහිනුම් තටාකය සඳහා අවශ්‍ය පවිත්‍රතා ද්‍රව්‍ය, ආම්පන්න සහ අනෙකුත් අවශ්‍යතා ඇතුළත් භාණ්ඩ කට්ටලයක්ද පරිත්‍යාග කරන ලදී.

## අයිස් ක්‍රීම් දන්සැලක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ පූර්ණ අධීක්ෂණය මත පොසොන් පුන් පොහොය දිනයට සමගාමීව අයිස් ක්‍රීම් දන්සැලක් ඉකුත් ජූනි 20 වන දින කොළඹ යුද්ධ හමුදාධිපති නිල නිවස ආසන්නයේදී පවත්වන ලදී. මෙහිදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියද එම දන්සැල විවෘත කිරීමේ අවස්ථාවට එක්වූවාය.

# පාසල් ළමුන් හට පාසල් උපකරණ කට්ටලයක්





ගංවතුර හේතුවෙන් ආපදා තත්වයට පත්ව ඇති බප/හෝ/වග ශ්‍රී රතනසාර මධ්‍ය විද්‍යාලයේ ළමුන් වෙත ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදුකරගැනීම සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ සත්කාරක වැඩසටහනක් ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වජිරා පෙරේරා මහත්මියගේ මගපෙන්වීම මත ඉකුත් ජුනි මස 14 වන දින සිදුකෙරිණ. හෙට දින අනාගතය භාරගැනීමට සූදානමින් සිටින දරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවෙන් සිදුකෙරෙන සමාජ සත්කාරක වැඩසටහන් මාලාවක තවත් දිගුවක් ලෙසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර, එම අවස්ථාවට සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ද සහභාගී වූහ.

# ගර්භණී මව්වරුන් වෙනුවෙන් පරිත්‍යාගයක්





සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නෙලූකා නානායක්කාර මහත්මියගේ ප්‍රධානත්වයෙන් පොසොන් පොහොය නිමිතිකොටගෙන එම රෙජිමේන්තුවට අයත් නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ගර්භණී බිරින්දෑවරු 67 දෙනකු සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. තවද සෙ/381719 ලා/කෝ බෝයගොඩ බීජීඅයියු යන කොනොනිගේ තුන් නිවුන් දරුවන් හට මාස 06 ක් සඳහා අවශ්‍ය ළදරු කිරිපිටි බෙදාදීමක් ද සිදුකෙරිණ. එහිදී අඹේපුස්ස කඳවුර ආසන්නයේ පදිංචි ගර්භණී තත්ත්වයෙන් පසුවන බිරිඳෑවරුන් 20 දෙනකු සඳහා සංකේතාත්මකව එම පරිත්‍යාග පිරිනැමූ අතර, අනෙකුත් රණවිරුවන් 47 සඳහා ඔවුන්ට හිමි ත්‍යාග පාර්සල් ඔවුන්ගේ නිවෙස් වෙතටම ගොස් ලබාදීමට කටයුතු කෙරිණ.

# බැතිමතුන් වෙනුවෙන් බෙලිමල් දන්සැලක්



යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියංගා වික්‍රමසිංහ මහත්මියගේ අදහසකට අනුව පසුගිය මැයි මස 23 වන දින රංගිරි දඹුලු රජමහා විහාරය ඉදිරිපිටදී දන්සැලක් පැවැත්විණ. එහිදී, දඹුල්ල විහාරස්ථානයට පැමිණි බැතිමතුන් වෙනුවෙන් සීනි සම්බල් බනිස්, බිස්කට් සහ උණුසුම් බෙලිමල් ලබාදෙන ලදී. යාන්ත්‍රික පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම දන්සැල සඳහා රෙජිමේන්තු මූලස්ථානයේ සියලු නිලයෝද සාමූහිකව එක්වූහ.

# 27 වන වාර්ෂික මහ සභා රැස්වීමේදී සත්කාර රැසක්





විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 27 වන වාර්ෂික මහා සභා රැස්වීම පසුගිය ජුනි මස 02 වන දින එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛා සභාපතිනි තුෂාරා යටිවාවල අළුවිහාරේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල "ද සැලියුට්" උත්සව ශාලාවේදී පැවැත්විණ. එම අවස්ථාවේදී පාසෙ ගුණවර්ධන ඒඩීඑ්එස් යන සෙනියාගේ පිළිකා රෝගයෙන් පෙළෙන දියණිය වෙත රුපියල් 50,000.00 ක වෛද්‍යාධාර මුදලක් ද සිවිල් සේවක අයිඑම් නිමල් කරුණාතිලක යන අයගේ විශ්වවිද්‍යාල වරම් ලැබූ පුතණුවන් වෙත රුපියල් 50,000.00 ක ශිෂ්‍යාධාර මුලදක් ද පරිත්‍යාග කෙරිණ. තවද, විජයබාහු පාබල රෙජිමේන්තු මුදලින් රුපියල් 500,000.00 ක් එම සේවා වනිතා ශාඛාවේ අභිවෘද්ධිය වෙනුවෙන් එම රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ සුරතින් පිරිනැමීමද එහිදී සිදුවිය.

# ගර්භණී මව්වරුන් වෙත පරිත්‍යාගයක්




කමාන්ඩෝ රෙජිමේන්තු සේවාවනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසක් මත දැනට රාජකාරි කරනු ලබන සෙසුනිළයින්ගේ හා සිවිල් සේවක මහතුන්ගේ ගර්භණී බිරින්දෑවරුන් හට අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 17 වන දින කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එම සේවාවනිතා ශාඛාව ප්‍රථම වතාවට සිදුකළ මෙම සත්කාරයේදී ගර්භණී මාතාවන් 28 දෙනකු සඳහා සංකේතාත්මකව භාණ්ඩ පාර්සල් බෙදාදුන් අතර, සිවිල් සේවක මහතකු වෙනුවෙන් පූර්ණ නිවාස ආධාර මුදලක් ද පිරිනැමිණ. කමාන්ඩෝ රෙජිමේන්තු සේවාවනිතා ශාඛාවේ සභාපතිනි නිමාලි රණතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට එම රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීපීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ද එක්විය.

# දරුවන් වෙනුවෙන් මාහැඟි පරිත්‍යාගයක්




විශේෂ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී අනෝජා පීරිස් මහත්මියගේ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ මහනුවර සිගිති සෙවණ ළමා නිවාසයේ දරුවන් 30 දෙනකු සඳහා පාසල් ලිපි ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 15 වන දින සිදුකෙරිණ. එහිදී එම දරුවන් වෙනුවෙන් කෙටි ආහාර සහ තේ පැන් සංග්‍රහයක් ලබාදීමටද කටයුතු කරන ලදී. මෙම අවස්ථාවට විශේෂ බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක් එක්වූහ.

# නව තනතුරෙහි රාජකාරී භාරගනිමින්



ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස උදිතා පෙරේරා මහත්මිය පසුගිය මැයි මස 30 වන දින පනාගොඩ ඉංජිනේරු සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී ආගමික වතාවත් මධ්‍යයේ රාජකාරී භාරගත්තාය. සභාපතිනිය එහිදී සිය සාමාජිකාවන් සමගින් ඉදිරි සුබසාධන වැඩකටයුතු පිළිබඳ සාකච්ඡාවකද නිරතවූහ.

# දැනුවත් කිරීමේ වැඩමුළුවක්





යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්‍ෂ මහත්මියගේ අදහසකට අනුව 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ අණදෙන නිලධාරී මේජර් කේඑම්එස්එන් ප්‍රේමරත්න යූඑස්පී එල්එස්සී ගේ අධීක්‍ෂණය මත ස්වයං රැකියාලාභීන් හට කුඩා පරිමාණ ව්‍යාපාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පසුගිය ජුනි මස 01 වන දින එම ඒකක දේශන ශාලාවේදී පැවැත්විණ. ඉෂානි නවරත්න මහත්මිය විසින් මෙහෙවනු ලැබූ මෙම වැඩමුළුවේදී ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඇසුරුම් බෙදාදීම ද සිදුකරන ලදී. ඊට සමගාමීව 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ සේවයේ නියුතු සෙසුනිලයින් 16 දෙනකු සහ සිවිල් සේවක මහතුන් 21 දෙනකු වෙත වියළි සලාක මලු බෙදාදීම ද සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ, සෙසුනිලයෝ හා සිවිල් සේවක මහත්ම මහත්මීහු රැසක් ද සහභාගී වූහ.

# සෝමාවතී පුදබිමේ ආගමික වතාවත් රැසක්





යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව මගින් පසුගිය ජුනි මස 01 වන දින සෝමාවතී රජමහා විහාරයේදී ආගමික වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී, කප්රුක් පූජාවක්, අෂ්ටපාන බෝධි පූජාවක් හා සංඝයා වහන්සේලා උදෙසා උදැසන දානමය පිංකමක් ද පවත්වනු ලැබීය. 3 ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ අණදෙන නිලධාරී සහ සෙසුනිලයින් විසින් සංවිධානය කරනු ලැබූ මෙම පුණ්‍ය කටයුත්තට ආඥාපති හකාස අණසක (උතුර) හා යුධෝපකරණ බලකා බලකාධිපති මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒඊටීඕ හා එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා ප්‍රනාන්දු මහත්මිය ප්‍රධානත්වය දැරූහ. මෙම අවස්ථාව සඳහා සේවා වනිතා සාමාජිකාවෝ, නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් ද එක්වූහ.

# ප්‍රජාසත්කාරක වැඩසටහන් රැසක්





75 වන යුද්ධ හමුදා දින සැමරුමට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාව මගින් අඩු ආදායම්ලාභී පවුල්වල දූ දරුවන් සඳහා ප්‍රතිලාභ සැලසීමේ ප්‍රජාසත්කාරක වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. එහි එක් අදියරක් ලෙස පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ආචාර්ය හිමාලි නියංගොඩ මහත්මියගේ මඟපෙන්වීම මත මෝදර ශාන්ත ජෝන් විද්‍යාලය වෙත රුපියල් 100,000.00 ක මූල්‍ය පරිත්‍යාගයක් හා මාස දෙකකට ප්‍රමාණවත් වියළි සලාක පරිත්‍යාගයක් සිදුකරන ලදී. 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ අණදෙන නිලධාරිනී මේජර් ඉනෝකා වදුමේත්‍රී ගේ අධීක්ෂණයෙන් සිදුකළ මෙම සත්කාරයේදී එම දරුවන් වෙත ප්‍රනීත ආහාර වේලක් ද පිරිනැමිණ.

# "සාහිත සංහිතා" විවෘත කෙරේ





සියලුම නිලයන් සඳහා පුස්තකාල පහසුකම් ලබාදීමේ අරමුණින් 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ අණදෙන නිලධාරිනී මේජර් ඩබ්ලිව්එම්ඩීඑම් ද සේරම් පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ ඉදිකළ "සාහිත සංහිතා" නව පුස්තකාලය පසුගිය ජුනි මස 12 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදුලා කස්තුරිමුදලි මහත්මියගේ සුරතින් විවෘත කෙරිණ. මෙම නව පුස්තකාලය ග්‍රන්ථ විශාල ප්‍රමාණයකින් සහ පුස්තකාල කළමනාකරණ පද්ධතියකින් සමන්විත වන අතර, සභාපතිනිය විසින් පොත්පත් කියවීමේ ඇති වැදගත්කම හා එතුලින් මානසික නිදහස පවත්වාගෙන යමින් රාජකාරි කටයුතු මෙන්ම පෞද්ගලික ජීවිතයට එය බලපාන ආකාරය පිලිබඳ සියලු නිලයින් දැනුවත් කිරීමටද කටයුතු කළාය.

# දූ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක්





කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වරුණි කුලතුංග මහත්මියගේ උපදෙස් මත එම බලකා සේවා වනිතා ශාඛාව වෙතින් 4(සේවා) කෘෂිකර්ම හා පශු සම්පත් බලකායෙහි රාජකාරී නියුතු භටපිරිස්හි ප්‍රාථමික පාසල් අධ්‍යාපනය ලබන දූ දරුවන් 20 දෙනකු වෙනුවෙන් පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගියදා පැවැත්විණ. උත්සවය අතරතුරදී එම භටපිරිස් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට දිවා භෝජන සංග්‍රහයක් ද පිරිනැමුණු අතර, සභාපතිනිය විසින් ඔවුන් සමග සුහද පිලිසඳරක යෙදෙන්නට ද අමතක නොකළහ. තවද, එම ඒකකයේ අඹ එටිනි නිෂ්පාදන කම්හලේ නිරීක්ෂක චාරිකාවකට ද සභාපතිනිය එක්වූවාය.




සාමාන්‍ය සෙබළ නිමල් සිරිවර්ධන (උඩුකය රහිතව) 1990 ජූලි 11 දින සිදුවූ කොකාවිල් ප්‍රහාරයෙන් දිවි බේරාගෙන් දින 09කට පසුව යාබද මාන්කුලම් කඳවුරට පැමිණීමේදී ලබාගත් ඓතිහාසික ඡායාරූපය.

(2024 අප්‍රේල් කලාපයේ ඉතිරි කොටස)....

# උදේපාලගේ කැමරාවෙන් මතු වූ මිලකළ නොහැකි ඓතිහාසික ඡායාරූපය

**මාන්කුලම් සටනේ මතක ඉතිරිකළ උදේපාලගේ කැමරාව...**

**මාන්කුලම් කඳවුරෙහි වෛද්‍ය සහායකයින් ලෙස කටයුතු කරන ලද්දේ සෙබළ මොහොට්ටි හා සෙබළ බණ්ඩාර නම් වෛද්‍ය බලකායට අයත් දෙදෙනෙකි. එහි සටන් ඇරඹීමට පෙර තුවාල ලබන තම සහෝදර සගයින්ට ප්‍රතිකාර කිරීම සඳහා ඔවුහු සූදානම්ව සිටියේ වෙනම බංකරයකය. සේලයින්, බැන්ඩේජ්, ප්ලාස්ටර් ඇතුළු සියල්ල සංග්‍රාමික ගමන් මලුවල බහා වේලාසනින්ම එහි සුරැකිව තබන්නට ඔවුන් ක්‍රියාකොට තිබුණේ අවදානමේ තරම දත් නිසාවෙනි. තුවාලකරුවන් තම බංකරයට රැගෙන ආ සැනින් වෛද්‍ය සහායකයින් පැවති සීමිත සම්පත් තුළින් වුව තුවාල ලැබුවන් වෙනුවෙන් උපරිම සත්කාර කිරීමට පසුබට නොවූහ.**

මේ අතර එළිය වැටෙද්දී මාන්කුලම් සටන සම්පූර්ණයෙන්ම පහව් තිබූ අතර කඳවුර පුරා සොයා බලා පරීක්‍ෂා කිරීමේ මෙහෙයුම් (Search and Clear Operation) අරඹා තිබිණ. එම කටයුතුවලදීද සෙබළ සූරියබණ්ඩාර පෙරමුණේම කටයුතු කළ පුද්ගලයා විය. මාන්කුලම් ප්‍රහාරය හමුවේ හමුදා භටයින් පස් දෙනකු හා සිවිල් සේවකයෙක් මියගොස් තිබිණ. එසේම, එම කඳවුරෙහි බණ්ඩාගාර නිලධාරී ලෙස කටයුතු කළ 2/ලුතිනන් ප්‍රසන්න ලියනගේ යන නිලධාරී සමඟ සැරයන් උදේපාල, සෙබළ ප්‍රේමරත්න, කෝප්‍රල් ආනන්ද ඇතුළු හය දෙනකුද තුවාල ලැබ සිටියහ.

මේ අතර තුවාලකරුවන් හා මළසිරුරු රැගෙන යාම සඳහා වව්නියාවේ සිට ගුවන් යානයක් පැමිණීමට නියමිත වූ නමුත් ඒ සඳහා ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කළ යුතු විය. එහිදීද වැඩි බරක් පැටවුණේ සෙබළ සූරියබණ්ඩාර වෙතය. එලෙස සියලු ආරක්‍ෂක විධි ක්‍රම අනුගමනය කිරීමෙන් අනතුරුව හදිසියේම එහි ගොඩබට හෙලිකොප්ටරය මඟින් තුවාල ලැබූවන්ද මියගිය සාමාජිකයින්ද ක්‍ෂණිකව පිටත් කර හැරුණේ සතුරු ප්‍රතිරෝධයක් ඊට එල්ල වීමට පෙරාතුවය. ඒ අතරම තවත් යමක් එහි සිදුවිය. එනම්, තුවාල ලැබ ගුවන් පථය අසල බංකරයේ බිම වැතිරී සිටි 2/ලුතිනන් ප්‍රසන්න ලියනගේ එම ඉරියව්වේ සිටින ඡායාරූපයක් ලබාගැනීමටද සෙබළ සූරියබණ්ඩාර කටයුතු කොට තිබීමයි.

අනුරාධපුර රෝහල කරා රැගෙන ආවද බරපතල තත්ත්වයේ පසුවූවන්ට ප්‍රතිකාර කිරීමට පහසුකම් එහි සීමිත විය. ඒ වනවිට පේරාදෙණිය රෝහලේ සේවයේ නියුතු වෛද්‍යවරයකුද එම රෝහලට පැමිණ තිබුණි. ඔහු නමින් වෛද්‍ය ළමාවංශ විය. එහිදී, ඔහු දන්වා සිටියේ තුවාලකරුවන් වහාම පේරාදෙණිය රෝහල වෙත මාරුකර යවන ලෙසත් එහිදී තම අධීක්‍ෂණය යටතේ ඔවුනට ප්‍රතිකාර කළ හැකි බවත්ය. ඒ අනුව සැරයන් උදේපාල, සෙබළ ප්‍රේමරත්න ඇතුළු තවත් බරපතල තත්ත්වයේ පසුවූ තුවාලකරුවන් කිහිපදෙනකු එදින රාත්‍රියේම පේරාදෙණිය රෝහල කරා රැගෙන යාමට කටයුතු කෙරිණ.

ඒ වනවිට මාන්කුලම් කඳවුර යම්තරමකට නිශ්චල බවක් ඉසිලීය. නමුත්, ත්‍රස්තවාදීන් හා කළු සටනක් යළි ඇති නොවූවද ත්‍රස්ත තර්ජන හා අවදානම කිසිසේත් අඩු නොවීය. මේ අතර, වැඩිපුරම අවධානය යොමුව තිබුණේ යාබද පිහිටි කොකාවිල් කඳවුර වෙතය. එය පිහිටා තිබුණේ මාන්කුලම් සිට කිලෝමීටර් 16.5 ක දුරකිනි. එහිද මාන්කුලම් කඳවුරට අයත් සහෝදර සාමාජිකයින් පිරිසක් සිටීම හේතුවෙන් කඳවුරු දෙක අතර නිරන්තරව සබඳතා පැවතිණ. ඉහත සියල්ල එසේ සිදුවෙද්දී සැරයන් උදේපාලගේ කැමරාවද තම භාරයේ සුරැකිව තබාගන්නට සූරියබණ්ඩාර අමතක නොකළේය. එමගින් ප්‍රදේශයේ හා කඳවුරේ අවස්ථා විටින් විට ඡායාරූප ගත කරන්නටද ඔහු කටයුතු කළේය.

මෙලෙස නවදුරටත් දින සති ගෙවී යන්නට විය. පෙර මාන්කුලම් කඳවුරට එල්ල වූ පරිද්දෙන්ම කොකාවිල් කඳවුරටද දැවැන්ත ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වන්නට වූයේ එහි සැමෝම අපේක්‍ෂා කළ පරිද්දෙන්මය. දින තුනක් තිස්සේ විටින් විට එල්ල වූ එම ප්‍රහාරයේ අවසානය සටහන්ව තිබුණේ 1990 ජූලි මස 11 වන දින ලෙසය. (එකී ප්‍රහාරය හමුවේ කොකාවිල් හි සිද්ධි දාමයක් සිදුවූ අතර, මා විසින් රචනා කරන ලද "අචිම්බක ගිනියම" කෘතියෙහි ඒ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සටහන්ව ඇත)

කොකාවිල් ප්‍රහාරයෙන් අනතුරුව

ත්‍රස්තවාදීන්ගේ තර්ජන යළි මාන්කුලම් වෙත එල්ල වන්නට විය. විශේෂයෙන්ම කොකාවිල් කඳවුර සම්පූර්ණයෙන්ම ත්‍රස්තවාදීන් අතට පත්වීම හේතුවෙන් ඔවුන්ගේ චිත්ත ධෛර්ය ඉහළ මට්ටමක පැවතිණ. උද්ගතව පැවති අවදානම හමුවේ වව්නියාව ප්‍රදේශ මූලස්ථානයේ අතිරේක හටපිරිසක් හදිසියේම මාන්කුලම් වෙත යැවීමට තීරණය කෙරුණි. ඒ අනුව 1990 ජූලි මස 12 වන දින උදෑසන මාන්කුලමට එම අතිරේක හට පිරිස ගොඩබටහ. ඊට කමාන්ඩෝ හා 3 ගජබා සෙබළු අයත්වූහ. වාර කිහිපයක් තුළදී ගුවනින් කඳවුර ආසන්න ප්‍රදේශයට ගොඩබැසි එම හටපිරිස් එහි ත්‍රස්තවාදීනට ප්‍රහාර එල්ල කරමින් මාන්කුලම්හි බලය තහවුරු කරගත්හ.

කොකාවිල් කඳවුර ත්‍රස්තවාදීන් අතට පත්වීමත් සමඟ එහි සිටිවුන් අතරින් දෙදෙනෙක් පිළිබඳ හැරෙන්නට සෙසු කිසිවකු ගැන හෝඩුවාවක් නොවීය. එම ප්‍රහාරයට දිනකට පසු දයානන්ද නම් සිවිල් සේවකයකු හා ඒඑම් සිරිවර්ධන නම් ආධුනික සෙබලෙක් පමණක් දිවි බේරාගෙන මාන්කුලම් වෙත පැමිණීමට සමත්වූහ. මෙලෙස සතියක් පමණ ගෙවෙද්දී කිසිවකු බලාපොරොත්තු නොවූ තවත් යමක් සිදුවිය. එනම්, කොකාවිල් ප්‍රහාරයෙන් දිවි ගලවාගත් නිමල් සිරිවර්ධන නමැති 2 විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් ආධුනික සෙබලෙක්ද කොකාවිල් ප්‍රහාරය සිදුවී දින 8 කට පසු මාන්කුලමට පැමිණීමය. ඒ වනවිට මාන්කුලම් ආරක්ෂක වළල්ලේ රාජකාරීන්හි නිරතව සිටි 3 ගජබා සෙබළු භාරයේ ඔහුව කඳවුරු පරිශ්‍රයට රැගෙන ඒමට ක්‍රියාකළ අතර, සෙබල සූරියබණ්ඩාර සතුව තිබූ කැමරා කාචයේ එම දුලබ සිදුවීමද සටහන් වූයේ කිසිවකු ඒ පිළිබඳ තැකීමක් නොකළ තත්ත්වයක් යටතේය.

මේ අතර එහි තවත් යමක් සිදුවිය. එනම්, මාන්කුලම්හි තත්ත්වය පාලනය කිරීමත් සමඟම එහි ආරක්ෂක කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා එවකට වව්නියාව ප්‍රදේශ මූලස්ථානයේ ආඥාපති වූ මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ඇතුළු පිරිස එහි පැමිණියහ. ඒ වනවිට 3 ගජබා බළඇණිය යටතේ එහි ආරක්ෂාව සිදුකෙරුණු අතර, පෙර සිදුවීමට මුහුණදුන් 3 සිංහ රෙජිමේන්තු සෙබළු ක්‍රමිකව ආපසු යැවීමට කටයුතු කෙරෙමින් තිබිණ.



1990 මාන්කුලම් ප්‍රහාරයෙන් 2/ලුතිනන් ප්‍රසන්න ලියනගේ බංකරය තුළ තුවාල ලැබ



තුවාල ලැබූ සැරයන් උදේපාල

ප්‍රදේශ මූලස්ථාන ආඥාපතිගේ පැමිණීම මාන්කුලම් කඳවුර තුළ සිටි සැමට ඉහළ වටිනාකමක් ගෙනදුන් අවස්ථාවක් විය. ඒ වෙනුවෙන් කඳවුරේ පිරිස් අතිශය කාර්යබහුල විය. ප්‍රදේශයේ අවට පවා ආරක්ෂාව තහවුරු කළ හටපිරිස් උපරිමයෙන් ඒ වෙනුවෙන් සූදානම්ව සිටියහ. මේ අතර ආඥාපතිවරයා සමඟ පැමිණි හෙලිකොප්ටර් යානා මඟින් කඳවුරෙහි සිටි 3 සිංහ හටපිරිස් වව්නියාව කරා පිටත්කර හැරීමට කටයුතු කෙරිණ. ඒ වනවිටත් ඔවුන් මාස කිහිපයක් තිස්සේ කුසට නිසි අහරක් ද නින්දක් ද නොමැතිව මාන්කුලම්හි සිදුකළ අසීමිත කැපකිරීම හේතුවෙන් පසුවූයේ බොහෝ සේ හෙම්බත්වය.

මාන්කුලමෙහි නික්මෙන 3 වන සිංහ හටපිරිස අතර සෙබල සූරියබණ්ඩාරද විය. එහිදී, ඔහුට ඒ සඳහා දුලබ අවස්ථාවක් හිමිවිය. එනම්, ඔහු යළි වව්නියාව බලා පිටත්වූයේ මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ගමන්ගත් හෙලිකොප්ටරයේමය. එහිදී, සිය ආපසු රැගෙන ඒම සඳහා අමතර කිසිවක් ඔහු සතු නොවීය. මාන්කුලම්හි පැවති සටන හමුවේ ඔහුගේ පුද්ගලික බඩුභාණ්ඩ සියල්ල විනාශ වී තිබිණ. නමුත්, අත මිටමොළවා ගත් සුවිශේෂී යමක් ඔහු සතුවිය. එයනම් උදේපාලගේ කැමරාවේ ඉතිරිව තිබූ අවසන් ෆිල්ම් රෝලය. එතෙක් කලක් පරිහරණය කළ කැමරාවද ඒ වනවිට ඔහු සන්තකයේ සුරැකිව තිබුණද ආඥාපතිවරයා රැගත් හෙලිකොප්ටරයේ එම කැමරාව රැගෙන යාම ඔහුට ගැටලුවක් මතුවිය හැකි යැයි බියවූ ඔහු එය මාන්කුම් කඳවුරේම තැනෙක දමා ඒමට ක්‍රියාකරන ලද්දේ කිසිවකුට නොපවසාය.

මාන්කුලම් සිට වව්නියාවට ගිය සෙබල සූරියබණ්ඩාර එතැන් සිට කෑගල්ල නම නිවසට යන ලද්දේ දීර්ඝ යුද්ධයකට මැදිව අත්දැකීම් සම්භාරයක්ද සහිතවය. ඔහු නිසි අහරක් හෝ නින්දක් නොලැබ මාන්කුලමෙහි විඳි දුක්ගැහැට කෙතරම්ද යන්න ඔහුගේ කෘෂවූ දේහය දෙස බැලීමේදී සිය නිවැසියන්ට පවා තේරුම් ගැනීමට අපහසු නොවීය. සූරියබණ්ඩාර මාන්කුම් සටනින් මියගිය බවටද වරක් ඔහුගේ නිවසට පණිවිඩ පවා ලැබී තිබුණි. කෙසේ හෝ ඔහු නැවත පැමිණෙන තෙක්ම ඔහු පිළිබඳ කිසිදු තොරතුරක් නොලද සිටි පවුලේ සාමාජිකයින්ට ඔහුව දැකීම අදහාගත නොහැකි අවස්ථාවක් විය. එලෙස තම නිවසට ගිය සූරියබණ්ඩාරගේ පළමු අවශ්‍යතාවය වූයේ හැකි ඉක්මනින් තමා සන්තක වූ ෆිල්ම් රෝල සුද්දකරවා ගැනීමය. එහි ඇති තම ඡායාරූප දකිනතෙක් නොඉවසිලිමත් වූ ඔහු කෑගල්ල නගර මධ්‍යයේ පිහිටි ස්ටූඩියෝවකට එය භාරදෙනු ලැබීය.

මේ අතර පේරාදෙණිය රෝහලෙහි සති තුනක පමණ කාලයක් ප්‍රතිකාර ලැබීමෙන් අනතුරුව සැරයන් උදේපාල ඇතුළු මාන්කුලම්හි තුවාල ලැබූවන් කොළඹ යුද්ධ හමුදා රෝහලට මාරුකර යැවුණු අතර, ඒවනවිට ඉන් කිහිප දෙනකුගේ තත්ත්වය තරමක් යහපත් අතට හැරෙමින් තිබිණ. මෙලෙස දින සති මාස ගතවෙද්දී තුවාල ලැබූවන්ද ක්‍රමිකව සුව ලබන්නට වූහ. එහෙත්, සැරයන් උදේපාලට සේම සෙබල ප්‍රේමරත්නටද ජීවිතවලට මුහුණ දෙන්නට වූයේ මාන්කුලම් ප්‍රහාරය හරහා ඉතිරි වූ සදාකාලික ආබාධද කරපින්නාගෙනය.

*(නව කොටසක් ලබන කලාපයේ..)*



ලුතිනන් කර්නල්
අජිත් චමින්ද විජේසිංහ

# "ජාතික සංහිඳියාවේ කැඩපතක් බඳු වන්නි ජනතාවට යුද්ධ හමුදාවේ නොනිමි මෙහෙවර"





වන්නි පුරවරය වූ කලී, වැව හා බැඳුනු සෞභාග්‍යමත් සංස්කෘතියකින්ද, වැව් බැඳි රාජ්‍යයේ පුරෝගාමී මෙහෙවරක තියැලෙන සිංහල, දමිළ හා මුස්ලිම් ජනයාගෙන් ද පිරී ඉතිරී ගිය සාමයේ සහජීවනයේ කැඩපතක් බඳු වූ පුරවරයකි. මෙය නැගෙනහිර මුහුදු තීරයේ චුන්ඩිකුලම් සිට කෝකිලායි දක්වාත් බටහිර මුහුදු තීරයේ මුලන්කාවිල් සිට සිලාවතුර දක්වාත්, ඒ 9 මාර්ගයේ දඹුල්ලේ සිට ඉරණමඩු දක්වාත් වූ මුළු වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 13866 කට ආසන්න භූමි ප්‍රමාණයකට එනම්, ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 1/5 කට ආසන්න වූ අතිශය වැදගත් භූමියකි. එසේම, මෙම පුරවරය බොදුනුවන්ගේ උතුම් අටමස්ථානයන්ගෙන් ද කිතුනුවන්ගේ පරම පූජනීය මඩු දේවස්ථානය මෙන්ම ඉස්ලාම් භක්තිකයන්ගේ ගෞරවාදරයට පත් ආදම්ගේ සොහොන් කොත ආදී ඓතිහාසික පූජා භූමි රැසකින් සමන්විත වූ අනුරාධපුරය, මන්නාරම, වව්නියාව හා මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයන් තුළ පශ්චාත් යුද වාතාවරණයෙන් පසු නැවත යුද ගිනි දැල් නොදැල්වෙන බවට සපථ විය හැකි ජාතික ආගමික සහජීවනය සහිත වටපිටාවක් ජනිත වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා සිවිල් ජනතාව එකිනෙකා අතර සහයෝගයෙන් දොරේ ගලායිය මනුෂ්‍යත්වය ලොවට පෙන්වන පුරවරයක් ලෙස ද හැඳින්වූවාට වරදක් නැත. එතරම් සමීප සබඳතාවක් යුද්ධ හමුදාව හා සිවිල් සමාජය තුළ මෙම ප්‍රදේශයේ ස්ථාවර වී ඇත්තේ පසුගිය කාලසීමාව පුරාම වන්නි ප්‍රදේශයේ සිදුකළ යුද්ධ හමුදා සිවිල් සමාජ සත්කාරක වැඩසටහන් සහ සේවාවන් තුළින් සියලු ජනතාවගේ හදවත් තුළ යුද්ධ හමුදාව පිළිබඳ මැවුනු සුබවාදී හා මානුෂීය ප්‍රතිරූපය දිනෙන් දිනම වර්ධනය වීම තුළය. විශේෂයෙන් අටමස්ථානාධිපති නුවර කලාවියේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය පල්ලේගම හේමරතන මහනායක හිමි, ශාස්ත්‍රපති පූජ්‍ය ඊතල වැටුණු වැව ඥාණතිලක මහනායක හිමි ප්‍රමුඛ බෞද්ධ හිමිවරුන්, අතිගරු ආචාර්ය ෆිඩෙලිස් ලයනල් එමානුවෙල් ප්‍රනාන්දු මන්නාරම, රදගුරුතුමන් හා මඩු දේවස්ථානය භාර ඒ ඥාණප්‍රකාෂම් පියතුමන් ඇතුළු අනෙකුත් කතෝලික පියතුමන්ලා, මුලතිව් වට්ටප්පලෙයි කණ්නගි අම්මාන් කෝවිලේ ස්වාමි කන්දදාස කුරුක්කල් ඇතුළු හින්දු පූජක තුමන්ලා මෙන්ම ඉස්ලාම් ආගමික නායකයන් සමග ඉතා ලබැඳි ගෞරවනීය සබඳතාවක් පවත්වාගෙන යන්නට යුද්ධ හමුදා වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය නිරන්තරයෙන්ම කටයුතු කිරීම පැසසිය යුතුය. එපමණක් නොව අනුරාධපුර, මුලතිව්,





වව්නියාව හා මන්නාරම දිස්ත්‍රික් ලේකම් තුමන්ලා අතර පවතින සබැඳියාව එකී දිස්ත්‍රික්කවල ජනතාවට ප්‍රතිලාභ සමඟ සංවර්ධනයේ මාවත විවර කරන්නට මහත් රුකුලක් සපයයි.

2023.07.17 වන දින ආරක්ෂක සේනා වන්නි ආඥාපති ලෙස මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ වැඩ භාරගැනීමෙන් පසු ලබාදෙන ලද විශිෂ්ට හා දූරදර්ශී නායකත්වය තුළ වන්නි ප්‍රදේශයට ලැබුණු ප්‍රතිලාභ අතිමහත්ය. අනුරාධපුර නගරයේ 21 වන සේනාංකයේ පිහිටා තිබෙන පිහිනුම් තටාකය ප්‍රතිසංස්කරණය කර ඉතා සහන මිලට ප්‍රදේශයේ දරුදැරියන්ට හා සිවිල් පුද්ගලයන් වෙත පිහිනුම් ක්‍රීඩාව සඳහා විවෘත කරදීමට හැකිවීම ඉතා අගනේය. එසේම, ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක කළ දෙවන පොල් ත්‍රිකෝණය උතුරට ව්‍යාප්ත කිරීමේ වැඩසටහනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සක්‍රිය දායකත්වය ලබාදෙමින් මේ වනවිට වන්නි ප්‍රදේශයේ පමණක් පොල් පැළ පනස් දහසකට අධික ප්‍රමාණයක් සිටුවා තිබේ. එසේම, වන්නි විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ටී මංගලේශ්වරන් මහතා හා එක්ව විද්‍යානුකූල තාක්ෂණය මුල්කර ගනිමින් වගාවන් සිදුකිරීමට අවැසි මාර්ගෝපදේශනයක් සඳහා සාකච්ඡාවන් විශ්ව විද්‍යාල ආචාර්ය වරුන් සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් සිදුවිය. එහිදී, එකී සමාජ සත්කාරයට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දායකත්වය පිළිබඳ සාකච්ඡා කළ අතර, එහි ප්‍රතිඵල ප්‍රදේශයේ ජනතාව අද බුක්ති විඳිමින් සිටී. විශේෂයෙන්ම ආගමික සහජීවනය ඉහළ නංවාලීමට අවැසි පරිසරය සකස් කිරීමට වන්නි ආඥාපති තුමන්ගේ මගපෙන්වීම මහත් අගය කළ යුතුය. මන්නාරම මඩු මාතා දෙව් මැදුරේ වාර්ෂික මඩු උත්සවය සාර්ථක කරගැනීමට උපරිම පහසුකම් සපයමින් හා කැරොල් සංදර්ශන හා අනෙකුත් උත්සව සංවිධානය කිරීම කැපීපෙනුනි.

තවද, දමිළ ජනතාවගේ මහත් ගෞරවාදරයට පත් ප්‍රධාන පෙළේ උත්සවයක් වන වට්ටප්පල් කෝවිලේ වාර්ෂික මංගල්‍යයට යුද්ධය නිමාවෙන් පසු වාර්ථා වූ වැඩිම බැතිමතුන් පිරිසක් සහභාගී වීමත් එහිදී ලක්ෂ අටකට අධික බැතිමතුන්ට අවැසි පහසුකම් සපයා දෙමින් ආහාර දන්සල්, වෛද්‍යාධාර පහසුකම් තුළින් ඔවුන්ට එම පූජා උත්සවය අතිසාර්ථකව නිමකරන්නට යුද්ධ හමුදාව දැක්වූ දායකත්වය, ජනතා ප්‍රසාදය ඉහලින් දිනාගන්නට මෙන්ම වඩාත් මානුෂීය හමුදාවක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දමිළ ජනතාව අතර ජනප්‍රසාදයට පත්වන්නට හැකිවීම විශේෂත්වයකි.

ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත්ව නගාසිටුවීම වෙනුවෙන් යුද්ධ හමුදා දායකත්වය තුළින් සාර්ථකව නිමකළ ව්‍යාපෘති ගණනාවකි. පසුගිය යුද සමයේ අකර්මන්‍යව අභාවයට යමින් තිබූ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ පිහිටා තිබූ පිගන් සංස්ථාවට අයත් උළු ගඩොල් කර්මාන්ත ශාලාව නැවත ආරම්භකර රටේ ආර්ථිකයට දායකත්වයක් ලබාදීමත් ඒ තුළින් ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථා උදාකරදීමේ පරමාර්ථයෙන් යුද්ධ හමුදා ශ්‍රමය හා සම්පත් දායකත්වයෙන් කර්මාන්ත ශාලාව අලුත්වැඩියා කටයුතු සිදුකිරීමත් ප්‍රදේශයේ කුරුඳු වගාව ව්‍යාප්ත කිරීම වෙනුවෙන් පර්යේෂණාත්මක අධ්‍යයනයකින් පසු ඊට අවැසි තාක්ෂණය හා ප්‍රයෝගික පුහුණුව මෙන්ම පැළ ලබාදෙමින් වන්නි ප්‍රදේශයට කුරුඳු වගාව හඳුන්වාදීමේ ගෞරවයද යුද්ධ හමුදාවට හිමිවිය යුතුය. දශක ගණනාවක කුරිරු යුද්ධයකට මුහුණදී අමිහිරි කටුක අත්දැකීම්වලින් යුත් මුලතිව් දිස්ත්‍රික්කයේ ජනතාවට ආර්ථික සංවර්ධනයේ නැවුම්





බලාපොරොත්තු ඇති කරමින් මුලතිව් පුරවරය දේශීය/විදේශීය සංචාරක පුරයක් ලෙස සංවර්ධනය කිරීමේ යෝජිත සැලැස්මට අඩිතාලමක් ලෙස යුද්ධ හමුදාවේ මැදිහත්වීමෙන් සංවිධානය කළ ව්‍යාපාරික ප්‍රජාව හා පැවති සාර්ථක රැස්වීමකින් පසුව හඳුනාගත් ප්‍රදේශ දියුණු කරමින් සංචාරක පුරවරයක් ලෙස දියුණු කිරීමට කටයුතු ආරම්භ කෙරුණි.


තවද, ආරක්ෂක සේනා මූලස්ථානය මගින් හේලිස් සෝලර් ග්‍රෑප් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සමඟ එක්ව 2024 ජනවාරි මස 03 වන දින සිට ක්‍රියාත්මක කරන ලද සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය යටතේ කිලෝ වොට් 230 ක ධාරිතාවයකින් ජනනය වන සම්පූර්ණ විදුලිය ජාතික විදුලිබල පද්ධතියට මුදාහරිනු ලැබේ.

එසේම, අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් නව නිවාස ඉදිකර දෙමින් ප්‍රදේශයේ ගැබිණි මාතාවන්ට පෝෂණ මලු බෙදාදෙමින්, දුෂ්කර ප්‍රදේශවල ජනතාවට වියළි සලාක මලු, සූර්යකෝෂ සහ ඇස් කන්නාඩි බෙදාදීම වැනි කාලෝචිත වැඩසටහන් ක්‍රියාත්මක කරමින් හදිසි අවස්ථාවන්හිදී ප්‍රදේශයේ රෝහල් සහ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා යුද්ධ හමුදා ශ්‍රම දායකත්වය ලබාදෙමින් තවදුරටත් සිංහල, දමිළ, මුස්ලිම් ජනතාව නොබෙදුණු රටක ශ්‍රී ලාංකිකයන් ලෙසින් ජීවත්වීමට අවස්ථාව ලබාදීමටත් එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ උදාර සංකල්පය හදවත් තුළ පෝෂණය කරන්නට රුකුලක් වන්නට යුද්ධ හමුදාවේ නොතිම් මෙහෙවර මහත් දායකත්වයක් සපයයි. විශේෂයෙන් පාසල සිසු දරු දැරියන්ට අවැසි පාසල් උපකරණ, පොත් පත් හා පාවහන් ආදිය බෙදාදෙමින් ප්‍රදේශයේ දරුදැරියන්ගේ ප්‍රයෝජනය උදෙසා ළමා උද්‍යාන ඉදිකරමින් අනාගතයේ පිපෙන්නට වෙර දරන මල් කැකුළු වන් ළමුන් වෙනුවෙන් ඉතා වටිනා මෙහෙවරක නිරත වන්නේය.

පසුගියදා වව්නියාව ක්‍රීඩාංගණයේ සහ මුලතිව් ක්‍රීඩාංගණයේ පැවති සිංහල දමිළ අලුත් අවුරුදු උත්සව අතිසාර්ථක ජනවාර්ගික සංහිඳියාවෙහි ප්‍රතිමූර්ති ලෙස දැක්විය හැකිය. වව්නියාව දිස්ත්‍රික් ලේකම් පීඒ සරත්චන්ද්‍ර මහතා, මුලතිව් දිස්ත්‍රික් ලේකම් ඒ උමා මහේෂ්වරම් මහතා සහ ප්‍රදේශයේ ප්‍රභූන් රැසකගේ සහභාගීත්වයෙන් මෙන්ම ප්‍රදේශයේ ජනතාවගෙන් පිරී ඉතිරී ගිය ක්‍රීඩාංගණයේ පැවති අලුත් අවුරුදු උත්සවයේ ඉසව්වලට ජනතාව ඉතා ප්‍රීතියෙන් හා සතුටින් එක්වී තිබීම ප්‍රියකරු දසුනක්ම විය. එසේ වර්ණවත් හා අලුත් අවුරුදු සිරිය කැන්දන අතිසාර්ථක අවුරුදු උත්සව යුද්ධ හමුදාව විසින් සංවිධානය කිරීමත් ඒ සඳහා ප්‍රදේශයේ අතිවිශාල ජනතාවක් එක් රැස්වීමක් තුළින් තවදුරටත් වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කවල ජනතාව ජාති ආගම් භේද පසෙකලා යුද්ධ හමුදාවේ ගෞරවනීය ඇරයුමෙන් එකා මෙන්ව අත්වැල් බැඳගෙන රටේ දියුණුව, සංහිඳියාව වෙනුවෙන් පෙරට එන බවට වූ කදිම සාක්ෂියකි.

වෙසක් පෝහොය නිමිති කොටගෙන යුද්ධ හමුදාව මුලතිව් පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ සංවිධානය කරන ලද වෙසක් කුඩු සහ ජාතක කථා ඇසුරින් කරන ලද නිර්මාණවලින් වර්ණවත් වූ වෙසක් කලාපය හා බත් දන්සල සඳහා අතිවිශාල ජනතාවක් පැමිණ සිටි අතර, දශක ගණනාවකට පසු එම ජනතාව රිසි සේ වෙසක් සිරි නරඹමින් වෙසක් බත් දන්සැල සඳහා සහභාගී වෙමින් ඉතා ප්‍රීතියෙන් සිටිනු දැකිය හැකිවිය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ශ්‍රී ලාංකික ජාතියේ ආරක්ෂකයා බව නැවත නැවතත් පසක් කරමින් පසුගිය කාලසීමාව තුළ පැවති අධික වර්ෂාව හේතුවෙන් වන්නි වැව් බැඳි රාජ්‍යයේ වැව් පිරී ඉතිරී අධික ධාරිතාවකින් යුක්තව වැව්බැම් බිඳියාමේ තර්ජනයට මුහුණදුන් අවස්ථාවේ ඒ තුළින් ජනතාවට හානිවීම වළක්වා ගන්නට සක්‍රිය දායකත්වය ලබාදෙමින් කඩිනමින් එම වැව්බැම් පිළිසකර කර ඇතිවිය හැකිව තිබූ මහත් ව්‍යසනයන් වළක්වා ගන්නට හැකිවිය. වත්මන් ශ්‍රී ලංකා යුද්ධ හමාදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ නිවැරදි නායකත්වය හා මගපෙන්වීම ඔස්සේ යුද්ධ හමුදාව ජාති ආගම් භේදයෙන් තොර මායිම් නොමැති ජනතාවාදී හමුදාවක් ලෙස ඕනෑම හදිසි අපදා තත්වයකදී ශ්‍රී ලාංකිය ජනයා සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කරන බව සක් සුදක් සේ පැහැදිලිය.



මේජර් පීආර් ශෝචානායක
ප්‍රමානි II (ඔර්ඩ්මේ අංශය)
ආශෝමු (චිත්‍ර)



212 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිවරයා ලෙස මා වැඩභාර ගන්නා විට, වත්මන් යුද්ධ හමුදාධිපති තුමන් එවකට 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස කටයුතු කරමින් සිටියා. එතුමාගේ දූරදර්ශී දැක්ම සහ මගපෙන්වීම මෙන්ම සමීප අධීක්ෂණය යටතේ දෙස් විදෙස් දානපතියන්ගේ මූල්‍ය අනුග්‍රහය ඇතිව අසරණ ප්‍රජාව සඳහා නිවාස ඉදිකිරීමේ තවත් ව්‍යාපෘතින් අඛණ්ඩව කරගෙන යාමට මට හැකි වුණා.

- මේජර් ජෙනරාල් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී

## සෙවණක් තනන්නට
# විරියක් දැරූ විරුවෙක්

මේජර් ජෙනරාල් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී දැනට ත්‍රිකුණාමලය 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස කටයුතු කරයි. කොළඹ - 07 රාජකීය විද්‍යාලයේ දීප්තිමත් ආදි සිසුවකු වන ඔහු 1990 සැප්තැම්බර් 07 වන දින ශ්‍රී ලංකා යුද හමුදාවට PMA-2 යටතේ සම්බන්ධ වී පාකිස්ථාන යුද්ධ හමුදා විද්‍යා පීඨය සහ දියතලාව යුද්ධ හමුදා විද්‍යා පීඨය වෙතින් මූලික පුහුණුව ලබා ඇත. යුද්ධ හමුදාව තුළ වසර 34 කට වැඩි සේවා කාලයක් සහිත අත්දැකීම් බහුල නිලධාරියකු වන ඔහු මෙරට තිස්වසරක් පැවති ත්‍රස්තවාදයට එරෙහි සටනේද සුවිශේෂී දායකත්වයක් දැක්වූ නිලධාරියෙකි.

සිය වෘත්තිය තුළ වූ මූලික කාර්යභාරයෙන් ඔබ්බට ගොස් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී අද වනවිට ඉටුකරන සුවිශේෂී මෙහෙවරක් පිළිබඳ වූ මෙම සාකච්ඡා සටහන දිගහැරෙනුයේ එමගින් ඔහු සමස්ත යුද්ධ හමුදාවටම ඉමහත් මෙහෙවරක් අත්කර දී ඇති නිසාමය. එය වූ කලී හිසට සෙවණක් නොමැති සිය ගණනකට සිය පුද්ගලික මැදිහත්වීම මත සෙවණ සදමින් ඔහු විසින් අරඹා ඇති සුවිශේෂී නිවාස ව්‍යාපෘතියක් පිළිබඳ කතාවකි. සැබැවින්ම ඔහු එමගින් සෙසු සැමටද සපයා ඇත්තේ කදිම ආදර්ශයකි. එලෙස හිසට සෙවණක් නොමැති සිංහල සහ දෙමළ ප්‍රජාවේ 250 කට අධික පිරිසකගේ නිවාස සිහිනය සැබෑ කරමින් සිදුකරන ලද ප්‍රශංසනීය සහ ආදර්ශමත් ප්‍රජා සත්කාරක ක්‍රියාව අගයමින් 2023 වර්ෂයේදී ඔහු යුද්ධ හමුදාධිපති ප්‍රශංසාත්මක පදක්කමෙන් ද පිදුම් ලබන්නේ එම සත්කාරයට උපහාර ලෙසය.

ඒ අනුව දිවයින පුරා නිවාස 43 ක් පුද්ගලික් මැදිහත්වීම මත ඉදිකර නිවාස නොමැති අයවලුන් වෙත පවරාදීමට කටයුතු කොට ඇති ඔහු නුදුරේදී විශ්‍රාම යාමට ප්‍රථම තවත් නිවාස 07 ක් ඉදිකරදීමට ද සැලසුම් කොට ඇත. එමෙන්ම, රුපියල් ලක්ෂ 13.5 කට වැඩි වටිනාකමකින් යුත් නිවාස 02 ක් ද ඔහුගේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ දැනටමත් නිමකොට ඇත. මෙවැනි ප්‍රජා මූලික ව්‍යාපෘති හරහා ඔහු සිය මෙහෙවර සිංහල දමිළ ජාති භේදයකින් තොරව සලසන්නට කටයුතු කොට ඇත්තේ ජන කොටස් අතර සංහිඳියාව ඇති කරමින් කදිම ආදර්ශයක්ද පෙන්වා දෙමිනි. මෙම මාහැඟි කටයුත්ත සඳහා විදේශීය මිතුරන්ගෙන් මෙන්ම අනෙකුත් දානපතියන්ගේ මූල්‍ය පරිත්‍යාග ලබාගැනීමට ද ඔහු සමත්ව ඇත. 22 වන පාබල සේනාංකයට අයත් බලප්‍රදේශයන්හි ජීවත්වන ජනතාව වෙනුවෙන් ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ ඔහු විසින් සිදුකර ඇති ප්‍රජා මූලික මෙහෙවර පිළිබඳව පාඨක ඔබ සැම දැනුවත් කිරීම මෙහි අරමුණයි.

**ප්‍රශ්නය:- මෙවැනි සමාජ සත්කාරක කාර්යයක් ආරම්භ කිරීමට ඔබ පෙළඹුනේ ඇයි? ඔබ එය ආරම්භ කරනු ලැබුවේ කවදාද?**

**පිළිතුර:-** මම වව්නියාවේ ආරක්ෂක සේනා මූලස්ථානයේ කර්නල් ප්‍රධාන මාණ්ඩලික ලෙස රාජකාරී කරන අවධියේදී එහි ආඥාපති ලෙස කටයුතු කළ මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ විසින් මෙවැනි ප්‍රජා සත්කාරක වැඩසටහන් තුළින් ඉමහත් තෘප්තියක් ලබනු දුටුවා. එමෙන්ම, දිනක් ඔහු වන්නි ප්‍රදේශයේ වෙසෙන ජනතාව වෙනුවෙන් යම් ප්‍රජාමූලික කාර්යයකට



සම්බන්ධ වී කටයුතු කරන ලෙස මට උපදෙස් ලබාදුන්නා. ඒ අනුව වැලිඔය, බෝගස්වැව ප්‍රදේශයේ වෙසෙන ජීවත්වීමට ආදායමක් නොමැති දරුවන් හතර දෙනකුගෙන් යුත් අසරණ පවුලක් සොයා ගැනීමට මට හැකි වුණා. දැවෙන ආර්ථික ප්‍රශ්න හමුවේ ඔවුන් සියදිවි නසාගැනීමේ තත්ත්වයකට පත්ව සිටියා. දරිද්‍රතාවය හමුවේ ඔවුන් දින දෙකක් පුරා කිසිදු ආහාරයක් පවා රැගෙන තිබුණේ නැහැ. කෙසේ වෙතත්, මගේ පුද්ගලික වියදමින් ඔවුන්ට ප්‍රමාණවත් කාලයක් සඳහා ආහාර ඇතුළු අනෙකුත් මූලික අවශ්‍යතා සලසාදීමට කටයුතු කරනු ලැබුවා. එමෙන්ම, මගේ මිත්‍රයකු වූ දිවයිනේ නම ගිය ව්‍යාපාරිකයකු ද වන (රාජා ජුවලර්ස් හිමිකරු - කොළඹ) අතුල එළියපුර මහතාට මෙම තත්ත්වය පිළිබඳව දැනුම් දීමෙන් පසු එක් නිවසක් පමණක් නොව තවත් නිවාස 03 ක් ඉදිකරදීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට එකඟ වුණා. ඒ වගේම ඉතිරි නිවාස දෙක තවත් අසරණ පවුල් දෙකකට පරිත්‍යාග කරන්නත් මට පුළුවන් වුණා.

ඉන් අනතුරුව, 21 වන පාබල සේනාංකය යටතේ ඇති 212 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිවරයා ලෙස මා වැඩභාර ගන්නා විට, වත්මන් යුද්ධ හමුදාධිපති තුමන් එවකට 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් කටයුතු කරමින් සිටියා. එතුමාගේ දූරදර්ශී දැක්ම සහ මගපෙන්වීම මෙන්ම සමීප අධීක්ෂණය යටතේ දෙස් විදෙස් දානපතියන්ගේ මූල්‍ය අනුග්‍රහය ඇතිව අසරණ ප්‍රජාව සඳහා නිවාස ඉදිකිරීමේ තවත් ව්‍යාපෘතින් අඛණ්ඩව කරගෙන යාමට මට හැකි වුණා. ඒ යුගයේදීත් සියලුම නවීන පහසුකම්වලින් සමන්විත නිවාස 25කට ආසන්න ප්‍රමාණයක් ඉදිකර දීමට අප පියවර ගනු ලැබුවා. එපමණක් නොව, ඔවුන්ට අවශ්‍ය විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ වැනි දෑ ලබාදීමටත් මට හැකි වුනා. ඒ අනුව එදින සිට මා මේ උදාර කර්තව්‍යය දිගටම කරගෙන යනවා. මේ වන විට මාගේ සමීප අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෙබළුන්ගේ ශ්‍රම දායකත්වයෙන් වවුනියාව, වැලිඔය කහටගස්දිගිලිය, තන්තිරිමලේ, අනුරාධපුර, මැල්සිරිපුර, කැකිරාව, කුරුණෑගල, ත්‍රිකුණාමලය, කන්තලේ, සේරුවාවිල, පුල්මුඩේ, මොරවැව, තඹුත්තේගම ප්‍රදේශවල අසරණ ජනතාව සඳහා නිවාස රැසක් ඉදිකර දී තිබෙනවා. වැලිමඩ, මාතලේ සහ





ඉදිකර දී ඇති අලංකාර නිවාස

දියතලාව මෙන්ම නුදුරු අනාගතයේ දී රටේ දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන අසරණ ජනතාව වෙනුවෙන් තවත් නිවාස රැසක් ඉදිකරදීමට ද මා දැනටමත් කටයුතු සැලසුම් කර තිබෙනවා.

**ප්‍රශ්නය:- මෙම නිවාස ඉදිකිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට සම්පත් දායකයින් (දානපතියන්) සොයා ගත්තේ කෙසේද?**

**පිළිතුර:-** ඔව්, මගේ පෞද්ගලික සම්බන්ධතා හරහා මෙම නිවාස ඉදිකිරීමට අදාළ මූල්‍ය අනුග්‍රහය මට ලැබුණේ, ඒ අනුව, මා විසින් කරන ලද ඉල්ලීම් පරිදි, ව්‍යාපාරිකයන්, වෛද්‍යවරුන් වැනි වෘත්තිකයන් ඇතුළු මගේ සියලුම විදේශීය මිතුරන් මෙන්ම දේශීය දානපතියන් විසිනුයි. මේ සඳහා අනුග්‍රහය දැක්වූයේ. ශ්‍රී ලංකාවේ අසරණ ප්‍රජාව සඳහා නිවාස තනා දීමේ මෙම උදාර කර්තව්‍යය සඳහා ඉංජිනේරුවන් සහ නීති උපදේශකයින් ස්වේච්ඡාවෙන් සහභාගී වුනා. මෙම සෑම නිවසක් වෙනුවෙන් විදුලිය, ජල සැපයුම, ද්විත්ව ඇඳන්, පුටු 06 සහිත කෑම මේස, රයිස් කුකර්, ගෑස් සිලින්ඩරයක් සහිත ගෑස් කුකර්, තුවා රාක්කයක් සහ ලීටර් 500 ක ධාරිතාවයකින් යුත් ජල ටැංකියක්ද අප විසින් ලබාදී තිබෙනවා. එසේම මෙම උතුම් කර්තව්‍යය සඳහා ස්ව කැමැත්තෙන් මූල්‍යමය ආධාර ලබා දෙන පරිත්‍යාගශීලීන්ට මම ස්තුතිවන්ත වෙනවා.

**ප්‍රශ්නය:- මෙම නිවාස ව්‍යාපෘතිය යටතේ එක් නිවසක් ඉදිකිරීම සඳහා කෙතරම් පිරිවැයක් ඇස්තමේන්තුගත කර තිබෙනවාද?**

**පිළිතුර:-** ඇත්තටම මම 2019 වර්ෂයේ ආරම්භ කරන මේ නිවාස ව්‍යාපෘතිය ආරම්භයේදීම නිවසක් ඉදිකිරීමට වැය වූ මුදල රුපියල් 550,000ක් පමණ වෙනවා. නමුත්, කාලය ගෙවී යද්දී රුපියලේ අගය අඩුවීමත් සමග ගොඩනැගිලි ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් උපකරණ වල මිල ගණන් වැඩිවීමත් සිදුවුණා. ඒ අනුව එක් නිවසකට රුපියල් මිලියන 13.5 ක් ලෙස සටහන් වුනා. කෙසේ වෙතත්, අපි කාමර දෙකක්, කෑම කාමරය, පැන්ට්‍රිය සහ වැරන්ඩා දෙකක් ඇතුළු නවීන උපාංගවලින් සමන්විත නානකාමරයක්ද එක් නිවසක් වෙනුවෙන් එක් කර තිබුණා.

> "හිසට සෙවණක් නොමැති සිය ගණනකට සිය පුද්ගලික මැදිහත්වීම මත සෙවණ සදමින් ඔහු අරඹා ඇති සුවිශේෂී නිවාස ව්‍යාපෘතිය හරහා සැබැවින්ම සෙසු සැමටද සපයා ඇත්තේ කදිම ආදර්ශයකි. මෙම මාහැඟි ප්‍රජා සත්කාරය සඳහා ඔහුගේ විදේශීය මිතුරන්ගෙන් මෙන්ම දේශීය දානපතියන්ගෙන්ද නොඅඩුව මූල්‍ය පරිත්‍යාග ලබාගැනීමට ද ඔහු සමත්ව තිබීම විශේෂත්වයකි."



ප්‍රජා සත්කාරක වැඩසටහන් දියත් කිරීම අරබයා මේජර් ජෙනරාල් ඩීඩබ්ලිව් පීරිස් ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී වෙත යුද්ධ හමුදාධිපති විසින් ප්‍රශංසාත්මක පදක්කම් පැළඳ වූ අවස්ථාව

**ප්‍රශ්නය:- එම නිවාස ඉදිකිරීමට අමතරව එම ප්‍රදේශයේ ජීවත්වන අසරණ ජනතාවගේ අනෙකුත් දැවෙන ප්‍රශ්න සඳහා ඔබ ගෙන ඇති වෙනත් ක්‍රියාමාර්ග මොනවාද?**

**පිළිතුර:-** ඔව්, ඇත්තෙන්ම 22 වන පාබල සේනාංකයට අයත් ප්‍රදේශවල ජීවත්වන ජනතාවට තිබෙන විශාලතම ගැටළුව තමයි පානීය ජලය නොමැතිකම. මෙම දැවෙන ප්‍රශ්නයට විසඳුමක් ලෙස ඔවුන්ගේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහා භූගත පානීය ජල නල පහසුකම් ලබාදීමට අප කටයුතු කළා. ඒ අනුව වැලිඔය, වවුනියාව, තන්තිරිමලේ ඇතුළු ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජල අවශ්‍යතා සපයා දුන්නේ භූගත නළ ළිං මඟිනුයි. එපමණක් නොව, මගේ සෘජු මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ සේරුවාවිල රජමහා විහාරස්ථානයේ දහම්පාසලට පැමිණෙන දරුවන් 350 දෙනකු සඳහා දස වතාවකට ආසන්න වාරයක් පමණ රසවත් දිවා ආහාර වේලක් ලබාදීමේ විශේෂ වැඩසටහනක් මා විසින් සංවිධානය කර ඇති අතර, එය ඉදිරි අවස්ථාවලදීද පැවැත්වීමට නියමිතය. ඊට අමතරව මගේ උපදෙස් පරිදි වෙසක් උත්සවයේ දී ත්‍රිකුණාමලයේ සැදැහැවතුන් වෙනුවෙන් දන්සැල් පැවැත්වීම ඇතුළු තවත් උතුම් කාර්යයන් කිහිපයක් මා යටතේ රාජකාරි කළ නිලධාරීන් ඇතුළු සෙසු නිලයින් විසින් සංවිධානය කර තිබුණා. ඒ හැර මා විසින් කරන ලද පෞද්ගලික ඉල්ලීමකට අනුව සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ වෙසෙන සිංහල හා දෙමළ ප්‍රජාව අතර සාමය සහ සහජීවනය වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් සංවිධානය කරන ලද "භාතිය සහ සන්තුෂ්" ඇතුළු ජනප්‍රියම කලාකරුවන් ඇතුළු ප්‍රමුඛ පෙළේ සංගීතඥයන් සහභාගී වූ අතිවිශේෂ සංගීත ප්‍රසංගයක් ද පැවැත්වුණා. තවද, යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි 2024 ඔක්තෝම්බර් 10 වන දිනට යෙදී ඇති යුද්ධ හමුදා දිනයට සමගාමීව නිවාස 15 ක් ඉදිකර ප්‍රතිලාභීන් වෙත භාරදීමට කටයුතු සූදානම් කර තිබෙනවා.



**ප්‍රශ්නය:- අවසාන වශයෙන්, මෙම සුවිශේෂී සම්මුඛ සාකච්ඡාව වඩා රසවත් කිරීම සඳහා එක්කිරීම වෙනුවෙන් ඔබගේ විශේෂ අදහසක් ඇතොත්?**

**පිළිතුර:-** ඔව්, ඇත්ත වශයෙන්ම ඉංග්‍රීසි භාෂාවේ කියමනක් තිබෙනවා "If there is a will" there is a way" යනුවෙන් ඉන් අදහස් වන්නේ ඕනෑම විශිෂ්ට ක්‍රියාවක් ඉටු කිරීම වෙනුවෙන් ඔබගේ දැඩි කැපවීමක් හා උත්සාහයක් තිබෙනම් අදාළ ඉලක්කය ඉතා පහසුවෙන් ජය ගැනීමේ හැකියාවක් ඔබට ඇති බවයි. එමෙන්ම, ඔබ සිවිල් සමාජය සමඟින් ඉතා හොඳ මහජන සම්බන්ධතාවයක් පවත්වා ගත යුතුය. ඔබ කර්නල්වරයකු, බ්‍රිගේඩියර්වරයකු හෝ මේජර් ජෙනරාල්වරයකු ආදී වශයෙන් කවර තරාතිරමක සිටියත් ඔබ සාමාන්‍ය ජනතාව සමඟින් ඉතා හොඳ මහජන සම්බන්ධතාවයක් වර්ධනය කරගත යුතු වෙනවා. එමඟින් හමුදාවේ ප්‍රතිරූපය වර්ධනය වී හමුදාව කෙරෙහි මිනිසුන් තුළ දැඩි විශ්වාසයක් ඇති කිරීමට හැකිවෙනවා.



සාකච්ඡා සටහන :-
ලුතිනන් දුමින්ද සෙනරත්
ජනමාධ්‍ය හා මිව්මේතුම



# සිත පාලනයට ක්‍රම 05ක්

පින්වත් යොවුන් දූ දරුවනේ,

ලිපියේ මාතෘකාව දැක්ක ගමන් ඔයාටත් හිතෙන්න ඇති "මේ ප්‍රශ්නෙ මටත් තියෙනවා" කියලා. ඔව්! මේක ගොඩක් අයට තියෙන ප්‍රශ්නයක්. "මගේ සිත පාලනය කරගන්නෙ කොහොමද?" කියන මේ ප්‍රශ්නෙ පවා කිසිම පාලනයක් නැතිව අපේ සිත්වලට එනවා.

සිතට අකමැති සිතුවිලි ම එන නිසයි ඇතැමුන්ට සිත පාලනය කරගන්න උවමනා. ඇතැම් අය සිත පාලනය කරන හැටි හොයන්නෙ හිතට එන මහා පව්වු සිතුවිලිවලින් බේරෙන්නයි. පාඩම් වැඩ කරද්දි හිත තමන්ට ඕන විදිහට තියාගන්න අමාරුයි. ඒ නිසයි ඇතැම් දූලා පුතාලා හිත පාලනය කරගන්න පෙලඹෙන්නේ. වැරදි බව දැන දැනත් වැරැද්දටම හිත යන නිසයි ඇතැම්මු සිත පාලනය කරන්න උත්සාහ ගන්නේ. පරණ දේවල්ම යළි යළි හිතෙනවා. අමතක කරන්න හිතන දේම යළි මතක් වෙනවා. ඒ නිසා තමයි ඇතැම් අයට සිත පාලනය කරගන්න ඕනි.

ඔය වගේ නොයෙක් හේතු නිසා "මගේ සිත පාලනය කරගන්නේ කොහොමද?" කියන ප්‍රශ්නෙ ඔයාලටත් ඇති.

ඉතිං සතුටු වෙන්න. අද මේ ලිපිය ඔයාලගේ ප්‍රශ්නෙ විසඳෙන ලිපිය. වෙනදා වගේම ආරම්භයේ දී ම බොහෝම සෙනෙහසින් සිහි කරනවා. මේ ලිපිය අවසන් වන තෙක් සිත පාලනය කරගෙන කියවන්න. "සිත පාලනය කරන හැටි" ඔයාලට හිතට දැනෙන විදිහට ඉගෙන ගන්න පුළුවන් වේවි!

## උත්තරේ හෙව්වේ හරිම තැනින්..!

ඔව්! අපි වාසනාවන්ත වුණා "සිත පාලනය කරන්නෙ කොහොමද?" කියන ප්‍රශ්නෙට උත්තරේ හරිම තැනින් හොයන්න. මොකක්ද හරිම විදිහට සිත මුළුමනින්ම පාලනය කරගෙන ධර්මය දේශනා කළ උතුමෙකුගේ අනුශාසනාව තුළයි අපි මේ ප්‍රශ්නෙට උත්තරේ හෙව්වේ. ඒ නිසාම අපි හරිම උත්තරේ ලබාගන්න වාසනාවන්තයි!

### 1. අඤ්ඤ නිමිත්ත ක්‍රමය.

ඒ කිව්වේ වෙනත් සිතුවිල්ලකට මාරු වීමේ ක්‍රමය. හරියට කිලිටි වුණ අත් දෙක ඒ අත් දෙකෙන් ම පිරිසිදු කරගන්නවා වගේ, අපි පාලනයකින් තොරව සිතට වද දෙන සිතුවිල්ලකින් බේරෙන්න නව සිතුවිල්ලක් ම භාවිත කරනවා.

අපි හිතමු, අපට වද දෙන්නේ ඉතාම පහත් සිතුවිල්ලක්. අපි ඒකට අකමැතියි. නමුත් යළි යළිත් ඒ සිතුවිල්ලමයි අපේ හිතට නැගෙන්නේ. අන්න එතකොට අපි මේ උපක්‍රමය යොදාගත්තොත්, වද දෙන නරක සිතුවිල්ල වෙනුවට අපි සුන්දර පින් සිතුවිල්ලක් - කුසල් සිතුවිල්ලක් මේ සිතට නංවාගන්නවා. එතකොට අර නරක සිතුවිල්ලට තිබුණු තැන නැති වෙනවා.

හොඳ දක්ෂ වඩුවෙක් ලීයක හිර වුණ ඇණයක් ගැලවීම පිණිස කරන්නේ ඒ හිර වුණ ඇණය උඩ වෙනත් ඇණයක් තියලා ගහන එකයි. ඇණයකින් ඇණයක් ගලවනවා වගේ සිතුවිල්ලකින් ම සිතුවිල්ලක් බැහැර කරන්න පුළුවන්.

### මේ වැරැද්ද නම් කරන්න එපා..!

ඇත්තෙන්ම වැරදි එකක් නෙවේ, බහුතරයක් වැරදි තුනක් කරනවා. කලබලය, තැවීම සහ බිය වීම තමයි ඒ වැරදි තුන. සිතට වද දෙන සිතුවිලි හේතුවෙන් කලබල වුණත් විසඳුමක් ලැබෙන්නේ නෑ, තැවි තැවී හිටියත් විසඳුමක් නෙවෙයි, සිතුවිල්ල ගැන බියට පත් වීමත් විසඳුමක් නෙවෙයි. ඒ නිසා ඔබ නම් ඔය වැරදි තුනෙන් එකක්වත් කරගන්න එපා. ඔබ කළ යුත්තේ මේ පළමු උපක්‍රමය කරන්න උත්සාහ කිරීමයි.

### 2. ආදීනව ක්‍රමය.

වද දෙන සිතුවිලි, කැත සිතුවිලි, පව් සිතුවිලි යළි යළි සිතේ නැගෙද්දී ඒ සිතුවිලි තුළම හිටියොත් ඇතිවෙන අවුල් ගැන නුවණින් කල්පනා කිරීම තමයි "ආදීනව ක්‍රමයේ දී කරන්නේ" මේ නරක සිතුවිලි නිසා මගේ සිතේ වෙහෙසක් ඇති වෙන්නේ. මට කිසිම සහනයක් නෑ. මොන අර්ථයක් ඇතිව ද මම මේවා හිතන්නේ. චීකේ... මම නම් මේ වගේ සිතුවිලි හිතමින් ඉන්නේ නෑ" කියලා නැවත නැවත අපි අපේම සිතට සිහිපත් කරන්න ඕනි. පාපී කැත සිතුවිලි පිළිකුල් කරන්න ඕනි.

ඔන්න ලස්සනට පිරිසිදුවට ඉන්න කැමති දුවක් හෝ පුතෙක් නාලා සුවඳ ගාලා ඉන්නවා. ඒ වෙලාවේ එයාගේ ඇඟට මැරුණු සර්පයෙක්ගේ කුණු වුණ මළකුණක් වැටෙනවා. එයා මුළු හිතින්මත්, මුළු සිරුරින්මත් "චීකේ..." කියලා අර මළකුණ බැහැර කරනවා. අන්න ඒ වගේමයි.

සිත ඒ දුව හෝ පුතා නම්, සර්ප කුණ තමයි වද දෙන පාපී සිතුවිල්ල. අපි කළ යුත්තේ "චීකේ" කියලා බැහැර කිරීමයි. මං හිතන මේ පහත් සිතුවිලි දෙවිවරු දැක්කොත් ඒ දෙවිවරු මා ගැන පැහැදීමට ලක්නොවෙයි. මට ආශිර්වාද කරන එකක් නෑ. ඒ වගේමයි මේ පහත් සිතුවිලි හිතමින් ඉද්දී "මං මැරුණොත්, මං අපායේ දුගතියේ උපදියි" ඔය විදිහට මෙලොව පරලොව වශයෙන් පවා අපි ආදීනව කල්පනා කළොත් හිතට වද දෙන පහත් ලාමක සිතුවිලි අපිට පාලනය කරගන්න ඒක හොඳ උපක්‍රමයක්.

### 3. අසති ක්‍රමය.

මේක නම් විශ්මිත ක්‍රමයක්. බුදුරජාණන් වහන්සේ දේශනා කළා තමන් අකමැති රූප ඉදිරියේ ඇස් පියා ගන්නවා වගේ, එහෙම නැත්නම් අහක බලාගන්නවා වගේ සිතට වදදෙන සිතුවිල්ලක් යළි යළි එද්දී (අසති) ඒ සිතුවිල්ල නොසිතා ඉන්න. (අමනසිකාර) ඒ සිතුවිල්ල මෙනෙහි නොකර ඉන්න.

මේ තුන්වෙනි ක්‍රමයෙන් විශ්මිත වේගෙන් හිත සුවපහසුවට ගන්න පුළුවන්. නමුත් මේක කළ හැක්කේ හොඳ සවිමත් සිතක් තියෙන කෙනෙකුට. ඉතිං ඔබත් සිත පාලනය කරගැනීමට මේ තුන්වැනි උපක්‍රමය යොදා ගන්න උත්සාහ කරන්න.

### 4. විතක්කමූලභේද ක්‍රමය.

සිතුවිල්ලේ මුල හොයාගෙන යෑම තමයි මේ උපක්‍රමය. මේ ගැන තේරුම් කරන්න බුදුරජාණන් වහන්සේ වදාළ උපමාවත් ඉතාම පැහැදිලියි.

ඔන්න එක මනුස්සයෙක් දුවමින් ඉන්නවා. ඔහු කල්පනා කරනවා "ඇයි මං මෙහෙම දුවන්නේ, මට පුළුවන් දුවන්නේ නැතිව සාමාන්‍ය විදිහට ඇවිද යන්න." එහෙම හිතලා ඔහු දිවීම නවත්තලා ඇවිදගෙන යන්න පටන් ගන්නා. එහෙම යද්දී හිතුණා "මම ඇවිදින්නේ අපරාදේ, මං නවතිනවා." ඔහු නැවතුණා. නැවතිලා ඉද්දී හිතුණා "කකුල් රිදෙනකං හිටගෙන ඉන්නේ අපරාදේ. මම ඉඳගන්නවා." ඔහු ඉඳගෙන හිතුවා "මම හාන්සි වෙනවා. ඒක ගොඩක් පහසුයි."

ඔය වගේ තමන්ගේ ප්‍රශ්නෙ මුල හොයනවාට කියනවා "විතක්ක මූලභේද ක්‍රමය" කියලා.

### 5. අභිනිග්ගන්හණ ක්‍රමය.

අපි හිතමු බොහොම අබල දුබල දුර්වල මනුස්සයෙක් ඉන්නවා. ඒ මනුස්සයා ළඟට බොහොම හැඩිදැඩි ශක්තිමත් මනුස්සයෙක් එනවා. මේ දෙන්නා අතරේ රණ්ඩුවක් ඇති වෙලා, අර බලවත් මනුස්සයා දුර්වල මනුස්සයා ව අල්ලාගෙන හොඳටම තලලා පෙළලා වෙහෙසට පත් කරනවා වගේ.

තමන්ට වද දෙන පාපී ලාමක සිතුවිල්ල දුර්වල මනුස්සයෙක් වගේ දැකලා බලවත් වීරියකින් පින් සිතුවිල්ලකින් ලාමක සිතුවිල්ල මඩින්න කියලයි බුදුරජාණන් වහන්සේ වදාළේ.

මේ උපක්‍රමය කිරීමට හොඳ ශක්තිමත් සිතක් තියෙන්න ඕනි. "මම මේ පාපී ලාමක සිතුවිල්ල දුරු කරනවාමයි" කියන අදහසින් දිව තල්ලට තද කරගෙන කුසල් සිතුවිල්ලකින් අකුසල් සිතුවිලි මඩින්න.

### ඉතින් පටන් ගන්න

"අත්තා' හි අත්තනෝ නාථෝ
කෝ'හි නාථෝ පරොසියා
අත්තනා'ව සුදන්තේන
නාථං ලභති දුල්ලභං"

"තමන්ට රැකගත යුත්තේ තමා විසිනුයි. බාහිර කෙනෙක් කොහොමද ඔබට රැකවරණයක් වෙන්නේ. තමාව ධර්මය තුළ දමනය කරගත්තොත් ඔබට ඉතා දුර්ලභ රැකවරණයක් ලැබෙනු ඇති"

(ධම්මපදය - අත්ත වර්ගය)

අති සාර්ථක උපක්‍රම පහකින් සිත පාලනය කරන හැටි ඉතාම සරලව මේ ලිපියෙන් ඔබට දැනගන්න ලැබුණා. ඉතින් පටන් ගන්න. එහේ මෙහේ දුවන සිත "ඔබ ඔබේ සිතෙන් ම පාලනය කරගන්න."

අපගේ බුදුසම්දාණන් වදාළේ.

(චිත්තං ගුත්තං සුඛාවහං) සිත ආරක්ෂා කළොත් සැප ලැබෙනු ඇති. (චිත්තං දන්තං සුඛාවහං) සිත දමනය කිරීමෙන් ද සැප ලැබෙන්නේ ය.

ඉතිං ඔබටත් මේ උපක්‍රම පහත් උපයෝගී කරගෙන සිත පාලනය කිරීමෙන් හැබෑම සැපයක් උදාවාගෙන සැනසිලිදායක සැපවත් ජීවිතයක් ගත කිරීමට වාසනාව ලැබේවා!



සටහන
ලක්මිණි රාධිකා



# ගුවන් නියමුවා සහ මහළු ගැහැනිය

**"98 වයසැති යුක්‍රේන ජාතික කාන්තාවක් සැතපුම් 06 ක් යුක්‍රේන රුසියා යුද පෙරමුණේ සිට ආරක්ෂා සහිත ස්ථානයකට පාගමනින් යයි"**

2024.05.03 වන දින ලෝක ප්‍රසිද්ධ අන්තර් ජාතික ප්‍රවෘත්ති වැනලයන් රැසක ප්‍රමුඛ පුවත මෙය විය. අනාගතයේ කෙදිනක හෝ තෙවන ලෝක යුද්ධයක් ඇති වුවහොත් ආසන්නතම හේතුව ලෙස සඳහන් කළහැකි යුක්රේන රුසියා යුද්ධය දැනට වසර දෙක ඉක්මවා ගොස්ය. සාපේක්ෂව ගත් කළ රුසියාවට වඩා යුක්‍රේන රජයට අහිමි වූ දෑ බොහෝය. බොහෝ තරුණ සෙබළුන් ලෝක ප්‍රබලයෝ වූ රුසියාවට එරෙහිව සටන් වැදීමට අවි අතට ගත්තේ තම රට  ජාතිය ආරක්ෂා කර ගැනීමට තිබූ පිවිතුරු හැඟීම පෙර දැරි කර ගෙනයි. ඒලෙසම ඒම තරුණ උද්යෝගය සියළු යුක්‍රේන වැසියන් සතු බව මෙම 98 හැවිදිරි ලිසියා ලොම්කොවුෂ්කා (Lidiia Lomikovska) ලොවටම පෙන්වා දුනි. දැනට කුඩා යෂ්ටියකුත් පා වලට සෙරෙප්පු කැබලි දෙකකුත් දමාගෙන අති නවීණ යුධ තාක්ෂණයක් යටතේ සටන් වදින ප්‍රබලතම රටවල් දෙකක යුද පෙරමුණේ වෙඩි උණ්ඩවලට නොබියව මුහුණදෙන මෙම මහළු ස්ත්‍රිය දැකීමෙන් මා හට ප්‍රසිද්ධ කියමනක් සිහියට ගෙන එයි. එනම්,

"දුෂ්කර කාලයක් ශක්තිමත් මිනිසුන් නිර්මාණය කරයි. ශක්තිමත් මිනිසුන් සුන්දර කාලයක් නිර්මාණය කරයි. සුන්දර කාලයන් දුර්වල මිනිසුන් නිර්මාණය කරයි. දුර්වල මිනිසුන් දැඩි කාලයක් නිර්මාණය කරයි" යන ලෝකප්‍රකට කියමනයි.

යුද්ධය සෑම විටම සියලු පාර්ශ්වයන්ට අහිමිවීම සිදුකරයි. සෑම යුද ඉතිහාසයක්ම අමරණීය මතකයක් ඉතිරි කරවයි. පුහුණුව ලත් සොල්දාදුවන්ගේ පමණක් නොව මෙවැනි අප්‍රකට සිවිල් ජනයාගේ වීර වික්‍රමයන්ද යුද ඉතිහාසයන්ගේ නොලිවීම වැලලී යන අවස්ථා අපමණය. මෙම මහළු කතගේ අමරණීය මතකය මා හට එවැනිම කැපකිරීමක් කළ රුසියානු ගුවන් හමුදා නිලධාරියකු සිහියට නගයි.

රුසියානු ලේඛක බොරිස් පොලෙවි (Boris Polevoy) විසින් රචිත " The story of a real man" සැබෑ මිනිසෙකුගේ කතාවක් යන කෘතිය මගින් මෙම ගුවන් නියමුවාගේ යුද ජීවිතයේ වික්‍රමාන්විතයන් මැනවින් ගෙන එයි. එහිදී, වරක් ඔහු ජර්මානු ගුවන් හමුදාවන් සමඟින් සටනකින් පසු තම ගුවන් යානය විනාශ වුවද පාගමනින්ම තමා නියම රුසියානු ගුවන් හමුදා නිලධාරියකු බව පෙන්වමින් දුෂ්කරතා මධ්‍යයේ කුසට අහරක් පවා නොමැතිව යුද්ධය නිසා සිදුවූ තුවාලද ඇතිව තමාගේ සගයන් සිටින ප්‍රදේශයට සතුරු කඳවුරු මග හරිමින් පැමිණෙන අයුරු විස්තර කරයි. පසු කලෙක යුද්ධය නිසා දෙපා අහිමි වූ ඔහු නැවත තමාට දෙපා නොමැතිව වුවද සටන් කිරීමට අවශ්‍ය බව ඉල්ලීම් කරයි.

යුද්ධය සඳහාම පුහුණුව ලත් ඒම ගුවන් නියමුවා මුහුණ දුන් දුෂ්කරතා වඩාත් හොඳින් ඒම රුසියානු ලේඛකයා ග්‍රන්ථය මගින් ගෙන හැර දක්වයි. අනාගතයේ කෙදිනක හෝ මෙලෙස යුක්‍රේන ලේඛකයකු විසින් මෙම වයස්ගත කාන්තාවගේ වික්‍රමයන් ග්‍රන්ථාරූඪ කරයි යැයි අපි නොඉවසිල්ලෙන් බලා සිටින්නෙමු.



ලුතිනන්
ජීඑම්ජී ලක්ෂාන්
23 විජයබා



# සෙබළ සිතුවිලි

## මා හැරගිය මාගේ පෙම්වතියට...

විල ලස්සනයි විල මැද සුදු මල් පිපුනොත්
මල් ලස්සනයි හැමදාමත් පර නොවුනොත්
තරු ලස්සනයි අහසට කළුවර තිබුණොත්
සිත දුක්බරයි ආදරයක් අහිමි උනොත්

එන්නට බැරිඋනා මට නුඹ බලන්නට
දෙන්නට දෙයක් නොතිබිණි දුප්පත් කමට
දෙන්නට තිබුණ දේ දුන්නා මම නුඹට
පිරිසිදු හදවතයි හැමදා රැකගන්න

එක් වන්නට සිතා දහසක් පැතුම් මවා
පස් අවුරුදු මසක් දිගටම ආලෙ කලා
නොපැතු නොසිතු වටකදී වෙන සිතක් බලා
ඉගිලුනි කිමද වෙන හදකට සතුට පතා

නැගණියකට වගේ ආලය කළ හන්දා
මායාවක් වගේ නුඹ මගෙ සිත බින්දා
ඡායාවක් වගේ මගෙ හද තුළ රන්දා
මිරිගුවකට මා මේ ලෙස පෙම් බැන්දා

සෙ/15කියු01548
සැරයන් අබේසිංහ ජීවම්වන්කේ
532 පාබල බසේමු

## මාද ඔබෙන් අසමි...

වෙහෙසකර ගමන් අතරතුර
මිහිරි පදවැලක දැහැන් ගත වෙද්දී
ඔබගේ දෑසට නැගෙන උණුසුම් කඳුලට මෙන්ම
රතුපාට මදහසට මා හේතුවක් විය හැකිදැයි
මම ඔබෙන් අසමි
කිමද මා එසේ වන බැවින්

වැහිබර සැඳෑවල හුදෙකලා දිගු රාත්‍රී තුළ
තනිකම දරාගන්න අසීරුම තැන්වල
ඔබේ මනසේ ඇඳෙන ඡායාව මා විය හැකි දැයි
මා ඔබෙන් අසමි
මාද එසේ වන බැවිනි
හදවත පෙලෙන ශෝකය මෙන්ම
හදවතේ උතුරන සොම්නසද
මගේ ඇස් ළඟ නැවතී සනසා ලන්නට
හැකිදැයි මම ඔබෙන් අසමි
මාද එසේ වන බැවිනි

සෙ/379680
සැරයන් රුවන් කුමාර එච්කේපීපී ආර්එස්පී
12 ශ්‍රීලංසිරෙ

## වැස්ස...

වැස්ස ඉතින් හනික එන්න
මිහිකත ගිනි නිවාලන්න
වැහි ලිහිණියන් පියාඹන්න
අහස පුරාවට දකින්න
සුනිල වලා ඔබ ඇඳෙන්න
හිරු රැස් සඟවා තබන්න
ඇළ දොළ ගංගා පිරෙන්න
වැස්ස ඉතින් පා කරන්න
දණ්ඩි පැටව් දිය කෙලින්න
සතුටේ උඩ පැන නටන්න
තුරුලිය හිස දිය නාන්න
අළුතින් සළුපිලි අඳින්න
නිල්ල පිරුණු කෙත දකින්න
බන්ඩි ගොයම හිනාවෙන්න
වැහි දෙව්දුව ඉතින් එන්න
එපා තවත් පමා වෙන්න

සෙ/629541
සැරයන් මාරසිංහ එම්එම්අයිඑම්
ගුවන් සංක්‍රමික බලසේනාව

## පිය පදවිය...

බුදුන් දෙසු බණපදයේ අරුත දෙන
ලැබුනම ජන්මය පාපයක් රැගෙන
විඳිනවා දුක හිගයක් නොමැතිව අප දෙපල
කළ වරදක්ද ගෙවනා මේ පෙර ආත්මයක

කැකුළු සිනා ඇසුනත් සිහිනෙන් නිදි රැට
සතපක් වෙයි දෝ එය අපි දෙදෙනාට
තිබුනාට නිදි යහනේ ඉඩ අපි අතර
තුම්පත් රැන නොමවෙයි පෙර කළ පවක

කිරි සුවඳින් අපෙ විමන නැහැවෙන්න
ඇතිවාද පෙරකල කුසලේ බල අපට
තිබුනාට යලි එන්න මෙලොවට පින
මදිවාද එය රත්නයක රුව බලන්නට

සෙ/427749 කෝප්‍රල් ඉසුර මධුසංඛ
ඩබ්ලිව්කේ
12 ගැහේබ
ජනමාධ්‍ය හා මව්මෙ අම


## දිලිඳුකම...


කටු මැටි පැලේ පන් පැදුරේ මා නිදියනවා
සිටු මැදුරේ සිරි යහනේ ඔබ සැතපෙනවා
ඔබ ගැන සෙහෙනෙ බැඳී හදකින් වැලපෙනවා
එය පවසන්න මගෙ හදවත මට පවසනවා

තුරු සෙවනේ ඔබ සමගින් එකට හිඳින්න
ඔබෙ මුවගේ දෙතොල් මතින් පහස විඳින්න
ඔබ දෑතේ පැටලීලා පෙමින් බැඳෙන්න
මගේ දිලිඳුකම මා හට හරස් නොවන්න

සෙ/535678
පාසෙ ලක්සිරි එම්පීඑම්කේ
1 විපාරෙ

# 2 වන ආසියානු විසිකිරීමේ ශූරතාවලියේදී, යුද්ධ හමුදාවෙන් දස්කම්







2 වන ආසියානු විසි කිරීමේ ශූරතාවලිය, ඉකුත් ජූනි මස 14 සහ 15 යන දිනයන් හි කොරියාවේදී පැවත්විණ. ඒ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් තරග වැදුණු ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සුවිශේෂී දස්කම් ප්‍රදර්ශනය කළහ. එහිදී, කාන්තා හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් මීටර් 57.94 ක දුරක් වාර්තා කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ මාණ්ඩලික සැරයන් නදීෂා ලේකම්ගේ සහ පිරිමි හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් මීටර් 77.57 ක දුරක් වාර්තා කරමින් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කෝප්‍රල් සුමේධ රණසිංහ ලෝකඩ පදක්කම් දිනාගත්හ.




# ජාතික මහා ක්‍රීඩා උළලෙහි කරාතේ ජයක්





"48 වන ජාතික මහා ක්‍රීඩා උළලෙහි කරාතේ තරගාවලිය - 2024" ඉකුත් ජූනි මස 6 වන සිට 9 වන දින දක්වා මාතර කොටවිල ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්විණි. මෙම තරගාවලිය සඳහා සහභාගී වූ යුද්ධ හමුදා ක්‍රීඩකයින් විශිෂ්ට දක්ෂතා දක්වමින් ඉසව් 07 ක් තුළින් රන් පදක්කම් 05 ක්, රිදී පදක්කම් 05 ක් සහ ලෝකඩ පදක්කම් 08 ක් දිනාගැනීමට සමත්වූ අතර, යුද්ධ හමුදා කාන්තා කණ්ඩායමේ සාමාජිකාවෝ ද ලෝකඩ පදක්කමක් දිනාගත්හ.

# අන්තර් බලඇණි දැල්පන්දු ශූරතාවලිය 2024



යුද්ධ හමුදා කාන්තා බලකායේ "අන්තර් බලඇණි දැල්පන්දු ශූරතාවලිය - 2024" අවසන් මහා තරගය එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් මැයි මස 30 වන දින සාර්ථකව පැවැත්විණි.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සමගින් එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදුලා කස්තුරිමුදලි මහත්මිය සහභාගී වූහ. තරගාවලිය සඳහා 1, 7, 2 (සේවා) සහ 3 (සේවා) යුද්ධ හමුදා කාන්තා බලකා නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගී වූ අතර, එහිදී 1 වන යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායම එහි ශූරතාවය දිනාගත්හ. අවසන් මහා තරගය සියැසින් නැරඹීම සඳහා එම රෙජිමේන්තු සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.












## ඔබේ ලිපි/නිර්මාණ අප වෙත එවන්න...

විශේෂාංග රාශියකින් සමන්විත නව මුහුණුවරකින් එළිදක්වන රණවිරුවාහි ඔබගේ ලිපි, නිර්මාණ වෙනුවෙන් වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඔබ ඇසූ දුටු අත්විඳි ඕනෑම දෙයක් නිර්මාණශීලීව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන කවි, නිසඳැස්, කෙටිකතා, ලිපි හා ඡායාරූප ආදිය (සුදුසු ඒවා) අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. ඔබේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක "රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර,
*ranaviruwa@yahoo.com*

# කෙටිකාලීන භෝජනාගාර සහායක පාඨමාලාව







ලායා බීච් හෝටලය වෙතින් පවත්වන ලද කෙටිකාලීන භෝජනාගාර සහායක පඨමාලාවෙහි සහතිකපත් ප්‍රදානෝත්සවය ඉකුත් ජූනි 18 වන දින එම හෝටලයේදී පැවැත්විණ. මෙම පාඨමාලාව සිසුන් 09 දෙනකුගේ සහභාගීත්වයෙන් වැඩකරන දින 45 ක් තුළ පවත්වන ලද අතර, එහිදී සනීපාරක්ෂාව, ආහාරපාන අංශයෙහි උපකරණ හැසිරවීම, ආහාරපාන නිවැරදිව පිළිගැන්වීම, ප්‍රභුවරුන් හට සංග්‍රහ කිරීම යන විෂය පරයන් ඔස්සේ පැවැත්විණ. තවද, එය හැදෑරීම තුළින් සමස්ථ යුද්ධ හමුදාවේම භෝජනාගාර සහයකයකු ලෙස රාජකාරී කිරීමට ඇති හැකියාව මෙන්ම විශ්‍රාම යාමෙන් පසුවද ලෝකයේ ඕනෑම රටක භෝජනාගාර සහයකයකු ලෙස ඉහළ වැටුප් තලයක රාජකාරී කිරීමේ අනගි අවස්ථාවද උදාවේ. ලායා බීච් හෝටලයේ සාමාන්‍යාධිකාරී කර්නල් ආර්ඒඑන්පී රණවීර මෙම අවස්ථාවට සහභාගී විය.


# රණවිරුවා





**අධීක්ෂණය**

මේජර් ජෙනරාල්
කේඑච්එන් රසික කුමාර
එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ජීඑච්එන් ද සා
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ හවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 ඔනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජේඑම් 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය





# අන්තර් ඒකක සරඹ තරඟාවලිය හා ජය සංකේත ප්‍රදානෝත්සවය 2024



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා "අන්තර් ඒකක සරඹ තරඟාවලිය හා ජය සංකේත ප්‍රදානෝත්සවය - 2024" එම බලකා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් රොහාන් ජයකොඩි ගේ ප්‍රධානත්වයෙන් කළුඅග්ගල කාන්තා බලකා පුහුණු පාසලේදී පසුගිය ජූනි මස 14 වන දින පැවැත්විණි.

තරඟාවලිය සඳහා 1, 7 ශ්‍රීලයුකාබ සහ 2, 3 (සේව) ශ්‍රීලයුකාබ ඒකක වෙතින් සරඹ ඛණ්ඩ 04 ක් සහභාගී වූ අතර, එහිදී සමස්ත ලකුණු තුළින් වැඩි ලකුණු ප්‍රතිශතයක් ලබාගනිමින් දක්ෂතම සරඹ ඛණ්ඩය ලෙස 1 යුද්ධ හමුදා කාන්තා බලකා සරඹ කණ්ඩය ශූරතාවය දිනාගනු ලැබීය. එම ඛණ්ඩයට අණදුන් කපිතාන් මධූකා තෙන්නකෝන් දක්ෂතම සරඹ කණ්ඩ අණදෙන නිලධාරිනිය ලෙස ද, 7 කාන්තා බලකා ඛණ්ඩයේ මාණ්ඩලික සැරයන් ධර්මිණි එන් දක්ෂතම සරඹ උපදේශකවරිය ලෙස ද ජය සංකේත හිමිකරගනු ලැබූහ.





රණබිමේ මතක

## යුධබිමේ ඉදුණු රසමසවුළු

උණුසුම් යුද බිමේදි උනත් උණුසුම් ආහාරයක් ගන්න රණවිරුවකුට ලැබෙන ඉඩකඩ ඉතාම සීමිතයි. ඒත් මොහොතකට හරි අවදානම පහව ගිය තැන්වලදී මේ වගේ රසමසවුලක් හදන්නත් රණවිරුවෝ පසුබට උනේ නැහැ. යුදබිමේ පයගැසූ කාටවත් මේ අත්දැකීම අමතක වෙන්න නම් විදියක් නැහැ.

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.